# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,899 — 1970 මාර්තු 26 වැනි බ්‍රහස්පතින්ද — 1970.3.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 242 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම ආදිය ... ... | 237 | මිළ පාලන දන්වීම ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දන්වීම ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම ආදිය ... | 239 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 247 |
| වෙනත් පත් කිරීම ආදිය ... ... ... | 240 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දන්වීම ... ... ... | 253 |
| | | " සුරාබද්ධ ආඥාපනත " පිළිබඳ දන්වීම ... ... | — |



## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

### 1970 අංක 102

අංකය : ඩී. 56/බී/සීඊආර්.

**යුද හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ද්විතීයනය කිරීමක් අවසන් කිරීම**

1970 මාර්තු මස 16 වැනි දින සිට, යුද හමුදා ස්වේච්ඡා බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා ස්ථිර බල හමුදාවේ සේවය පිණිස ද්විතීයනය කිරීම අවසන් විය.

මේජර් ඇලන් ටොලන්ස් නුගවෙල, ල. සි. රෙ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 17 දින,
කොළඹ දීය.

3-721

### 1970 අංක 103

අංකය. ඩී. 1/ආර්ඊසීපී/64.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීමක්**

පහත නම් සඳහන් කර ඇති මහතා, 1970 මාර්තු මස 5 වැනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවේ කපිතාන්වරයෙකු වශයෙන් අධිකාරියට පත්කිරීම හා එම දින සිට ඔහුව ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට ඇතුළත් කිරීම අනුමත කිරීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ප්‍රසාදය පළ කොට ඇත.

දොන් තිලක් නිල්කමල් සේනානායක මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 17 දින,
කොළඹ දීය.

3-707

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**1968 දෙසැම්බර් මස 14 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

---

**1970 අංක 104**

අංකය : ඩී/විඑප්/17/ඒ (vi)

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද නිලයෙහි ස්ථිර කිරීම් සහ උසස් කිරීම්**

1970 ජනවාරි මස 1 වැනි දින සිට මේජර් වරුන් වශයෙන් :—

කපිතාන් (තාවකාලික මේජර්) මාතරගේ දයා චන්ද්‍රරත්න කරුණාසේකර, ලං. ශී. බ.

කපිතාන් ජෝර්ජ් කිත්සිරි විජේනායක වීරරත්න, ලං. ශී. බ.

කපිතාන් (තාවකාලික මේජර්) ආතර පියදාස රණවීර, ලං. ශී. බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 11 දින,
කොළඹ දී ය.

3-542

---

**1970 අංක 105**

අංකය : ඩී. 251/ආර්ජ්සීව්/3.

**රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1968 ජූලි 15 වැනි දින සිට උපදේශක ලුතිනන් කොමාඩර් පදවියට :

උපදේශක ලුතිනන් වී. මහාදේව, රා.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 11 දින,
කොළඹ දී ය.

3-612

---

**1970 අංක 106**

අංකය. 251/ආර්ජ්සීව්/3.

**රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1969 ඔක්තෝබර් මස 29 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් වශයෙන් :—

ලුතිනන් ඒ. ආර්. ක්‍රිස්ටෝෆ්පල්ස්, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 17 දින,
කොළඹ දීය.

3-706

---

**1970 අංක 107**

අංකය. ඩී. 251/ආර්ජ්සීව්/3.

**රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට ලුතිනන්-කොමාන්ඩර් (ඉ) වශයෙන් :—

ලුතිනන් (ඉ) එම්. ආර්. තර්මසීලන්, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 14 දින,
කොළඹ දීය.

3-705

---

**1970 අංක 108**

අංකය. ඩී. 251/ආර්ජ්සීව්/3.

**රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1970 පෙබරවාරි මස 1 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් වශයෙන් :—

ලුතිනන් ජේ. ජයසූරිය, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 17 දින,
කොළඹ දීය.

3-708

---

**1970 අංක 109**

**අංකය : ඩී. 42/ආර්ජ්සීව්/(III)**

**රාජකීය ලංකා නාවික හමුදාව—නිලධාරීන්ගේ පත් කිරීම්**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවේ පහත සඳහන් පත් කිරීම අනුමත කිරීමට ප්‍රසාදය පළ කර ඇත.

1970 පෙබරවාරි මස 15 වෙනි දින සිට රා. ලං. ළිහිණියා නෞකාවේ අණදෙන නිලධාරී වශයෙන් :—

ලුතිනන් එම්. ඒ. ජේ. ඇන්ඩ්‍රිස්, රා. ලං. නා. හ.

2. 1970 ජනවාරි මස 2 වෙනි දින අංක 14,887 දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ 1970 අංක 3 දරණ නිවේදනය මෙයින් අවලංගු කෙරේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 12 දින,
කොළඹ දී ය.

3-613

---

**1970 අංක 110**

අංකය : ඩී. 252/ආර්ජ්සීව්/4.

**රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1970 මාර්තු මස 1 දින සිට විං කොමාන්ඩර්වරු වශයෙන් :—

ස්කොඩ්රන් ලීඩර් (තාවකාලික විං කොමාන්ඩර්) ඩග්ලස් වික්‍රමසිංහ (01020) කාර්මික/ඉංජිනේරු.

ස්කොඩ්රන් ලීඩර් (තාවකාලික විං කොමාන්ඩර්) වෙල් ආරච්චිගේ දොන් හැරල්ඩ් සුපතිපාල විජේසිංහ ගුණතිලක (01035) පොදු සේවා/නියමු.

ස්කොඩ්රන් ලීඩර් රත්නසබාපති විවේකානන්දන් (01034) පොදු සේවා/නියමු.

ස්කොඩ්රන් ලීඩර් ඩික් කත්බර්ට් පෙරේරා (01037) පොදු සේවා/නියමු.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 19 වන දින,
කොළඹ දීය.

3-719

1970 අංක 111

අංකය : ඩී. 23/ආර්ජ්සීපී/133.

### රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 අප්‍රේල් මස 1 වෙනි දින සිට රාජකීය ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගනු ඇත:—

ස්කොඩ්රන් ලීඩර් පෙරිඅන්නන් සුන්දරම් අලගේස්වරන්—(01085) වෛද්‍ය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 19 වෙනි දින,
කොළඹ දීය.

3-720

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1970 අංක 112

### අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය

අංකය : ජේඑම්/ජී. 40/66

බී. ආර්. සිල්වා මහතා 1970 මාර්තු මස 16 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66

එස්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඊ. ඒ. විජේකුලසූරිය මහතා 1970 මාර්තු මස 16 දින මාතලේ පිහිටි උසාවියේ මහ නුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ මහෙස්ත්‍රාත් තැන සහ මාතලේ රික්වෙස්ට් කොමසාරිස් තැන, මාතලේ ළමා මහෙස්ත්‍රාත් තැන සහ නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑස්සී/පීපී. 1/70

ආර්. ඩී. බී. ජයසේකර මහතා 1970 මාර්තු මස 19 දින සිට ලංකා අධිකරණ සේවයේ වැඩබලන නිලධාරියෙකු සහ අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ එදින සිට අයි. ජී. එන්. ද ජේ. සෙනෙවිරත්න මහතා නැති අතර කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඒ. 38/48

එස්. ජෝකනාදන් මහතා ඔහුගේ වෙනත් රාජකාරි වලට අතිරේක වශයෙන් කුරුණෑගල ම්. උ. අංක 64072 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස, 1970 අප්‍රේල් මස 7 දින සිට කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඒ. 38/48

වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා ඔහුගේ වෙනත් රාජකාරි වලට අතිරේක වශයෙන් මහ නුවර ම. උ. අංක 60597, 63615 සහ 64101 දරණ නඩු ඇසීමට සහ අසා අවසාන කර තීන්දු දීම පිණිස, 1970 අප්‍රේල් මස 5 දින සිට මහ නුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 7/67

කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එම්. එම්. කාසිම් මහතා 1970 මාර්තු මස 8වැනි දින, පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 31/65

සී. එස්. ඩී. පී. ආර්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. ඒ. තෙන්නකෝන් මහතා 1970 මාර්තු මස 11 දින සිට 16 දින දක්වා, කුලියාපිටියේ පළාත් ආණ්ඩු සහා සීමාව තුළ කතදුල්ලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 19/57

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සුරවීර මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 10/65

සී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. මතවරාජා මහතා 1970 පෙබරවාරි මස 27 දින සිට මාර්තු මස 3 වැනි දින දක්වා, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ත්‍රිකුණාමලයේ ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 10/65

සී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඒ. පී. තුරෙසිනායගම් මහතා 1970 පෙබරවාරි මස 26 දින සහ මාර්තු මස 4 දින සිට 9 දින දක්වා, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ත්‍රිකුණාමලයේ ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 13/67

බී. එස්. වික්‍රමසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. යූ. කරවිට මහතා 1970 මාර්තු මස 3 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත, දකුණ, උතුර, නැගෙනහිර සහ බස්නාහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හී ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 7/59

සුධර්මා ධර්මදාස මහත්මිය නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, චන්ද්‍රපාල කුමාරගේ මහත්මා 1970 මාර්තු මස 18 දින, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ, පහල බුලත්ගම, අටළුගම් සහ පතාවල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරලේ සහ කුරුවිට කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 4/50

එස්. ටී. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. කුමාරනායගම් මහතා 1970 මාර්තු මස 23 වැනි දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තු ගම්බද උසාවි සභාපති සහ කඩ්ඩුකුලම් පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 6/68

කේ. ජී. ජයසේන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. බී. දෙහිගම මහතා 1970 මාර්තු මස 28 වැනි දින, මහ නුවර දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ සහ නැගෙනහිර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 7/64

අයි. කිරුපාකරන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. ඒකම්පරම් මහතා 1970 මාර්තු මස 23 දින සිට 26 වැනි දින දක්වා සහ 28 සහ 31 දිනයන් හී සහ අප්‍රේල් මස 1 වැනි දින සිට 4 වැනි දින දක්වා, යාපනය දිස්ත්‍රික්යේ දිවයින්වල සහ බටහිර වලිකාමම් හී ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 18 දා,
කොළඹ 12,
තැ. පෙ. අංකය 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කායාලයේ දී ය.

3-660

## වෙනත් පත් කිරීම් ආදිය

**1970 අංක 113**

**ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇත :—**

75/10/48 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ එම්. එස්. පෙරේරා මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

75/1/15 (එම්සීඑ) V.

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ එම්. එල්. ජේ. වික්‍රමරත්න මහතා 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මාතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයා වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ පී. එච්. පී. ද සිල්වා මහතා 1969 දෙසැම්බර් මස 1 වැනි දින සිට 1970 පෙබරවාරි මස 7 වැනි දින දක්වා ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න මහතා 1969 දෙසැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයා වශයෙන්.

75/10/118 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ඒ. බී. ඇල්කඩුව මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

75/10/67 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ පී. කාසිලිංගම් මහතා 1970 ජනවාරි මස 26 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

75/2/2 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ පී. එච්. පී. ද සිල්වා මහතා 1970 පෙබරවාරි මස 8 වැනි දින නැවත නියමයක් කරනතුරු වාණිජ අධ්‍යක්ෂ වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ පී. කාසිලිංගම් මහතා 1970 පෙබරවාරි මස 9 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සහකාර වාරිමාර්ග අධ්‍යක්ෂ (පාලන) වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ටී. පද්මනාදන් මහතා 1970 පෙබරවාරි මස 9 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස් වශයෙන්.

75/2/61 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ආචාර්ය පී. රාමනාදන් මහතා 1970 පෙබරවාරි මස 15 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

75/3/48 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එස්. සී. නානායක්කාර මහතා 1968 ඔක්තෝබර් මස 31 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මුදල් අමාත්‍යාංශයේ (ලං.ප.සේ. III වැනි පන්තිය) සහකාර ලේකම් වශයෙන්.

75/10/112 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එන්. සී. ජෙගනාදන් මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ජාතික ඉතිරිකිරීමේ කොමසාරිස් වශයෙන්.

75/4/53 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ වී. එල්. සී. පීටර්ස් මහතා 1969 දෙසැම්බර් මස 19 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ජ්‍යෙෂ්ඨ සහකාර ධීවර අධ්‍යක්ෂ වශයෙන්.

75/4/16 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ ටී. ඒ. ගුණවර්ධන මහතා 1969 දෙසැම්බර් මස 20 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ඉඩම් සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

75/1/14/48 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ පී. වී. තාම්බර් මහතා 1970 ජනවාරි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විදේශ සම්පත් අංශයට අනුයුක්තව සිටීමට.

75/1/18/3 (බී) (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ ඩබ්ලිව්. කේ. ඒ. පී. පී. අබේසිංහ මහතා 1970 ජනවාරි මස 5 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු (ලං.ප.සේ. IV වැනි පන්තිය) පළාත් පාලන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ කේ. එන්. සමරසිංහ මහතා 1970 ජනවාරි මස 28 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

75/1/14/95 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ එච්. එච්. බණ්ඩාර මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

75/1/23/6 (එම්සීබී) VI.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ඩබ්ලිව්. ජී. සඳගම් මහතා 1969 ඔක්තෝබර් මස 26 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ (මහජන සම්බන්ධතා) ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

75/10/962 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ පී. වී. ඒ. ජේ. පීරිස් මහතා 1969 නොවැම්බර් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සහකාර කම්කරු කොමසාරිස්වරයෙකු වශයෙන්.

75/10/1176 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එස්. ඩබ්ලිව්. සූරියආරච්චි මහතා 1969 දෙසැම්බර් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සහකාර කම්කරු කොමසාරිස්වරයෙකු වශයෙන්.

75/10/846 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ සී. එච්. ඩී. දිසානායක මහතා 1969 දෙසැම්බර් මස 15 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සහකාර රබර් පාලකවරයෙකු වශයෙන්.

75/1/23/6 (එම්සීබී) VI.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ආර්. විජේරත්න මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එස්. ඒ. ජිනදාස මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයේ දකුණු නුවර පළාත කෝට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එස්. ජයහන්තන් මහතා 1970 ජනවාරි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු යාපනය පාලන දිස්ත්‍රික්කයේ වඩමරච්චි දකුණ හා බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ඊ. ඒ. නානායක්කාර මහතා 1970 ජනවාරි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කළුතර පාලන දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ දකුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එම්. ජේ. කරුණාසේකර මහත්මිය 1970 ජනවාරි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

75/1/14/2 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ඩී. වීරපාන මහතා 1970 ජනවාරි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරියෙකු වශයෙන්.

75/1/23/6 (එම්සීබී) VI.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ කේ. ජී. විමලරත්න මහතා 1970 ජනවාරි මස 18 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මාතර පාලන දිස්ත්‍රික්කයේ (මුලසෘත) ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

75/5/33 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ජී. බී. රාජපක්ෂ මහතා 1970 ජනවාරි මස 27 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරියෙකු වශයෙන්.

75/10/541 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ අයි. ඒ. එදිරිවීර මහතා 1970 ජනවාරි මස 27 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

75/1/23/6 (එම්සීබී) VI.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එම්. තම්බිමුත්තු මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු යාපනය පාලන දිස්ත්‍රික්කයේ වඩම්මරච්චි උතුරු හා නැගෙනහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ පී. බී. රත්නායක මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ඩී. බී. ලියනගෙදර මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ (මුලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

75/5/33 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ඊ. එම්. විජේරත්න බණ්ඩා මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මුළු දිවයින සඳහාම සහකාර ආහාර පාලකවරයෙකු සහ සහකාර මිළ (ආහාර) පාලකවරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ පී. එච්. ඩී. විජේසූරිය මහතා 1970 පෙබරවාරි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මෝටර් රථ ප්‍රවාහණ සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

75/5/27 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එන්. සිවසිතම්පරම් මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අලෙවි කිරීමේ සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

75/5/33 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ඊ. පී. ගුණසේන මහතා 1970 පෙබරවාරි මස 7 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

75/10/385 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එම්. අන්තෝනි මුත්තු මහතා 1970 පෙබරවාරි මස 7 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

75/5/8 (එම්සීබී) II.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ පී. සී. එම්. ඩයස් මහතා 1970 පෙබරවාරි මස 10 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කළුතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාල සහකාර වශයෙන්.

75/1/14/61 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එම්. රාසනායගම් මහතා 1970 පෙබරවාරි මස 15 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ආනයන හා අපනයන සහකාර පාලකවරයෙකු වශයෙන්.

75/1/23/6 (එම්සීබී) VI.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ආර්. ඩබ්ලිව්. එච්. එම්. තිලකරත්න මහතා 1970 මාර්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ (මහජන සම්බන්ධතා) ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

75/10/1043 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ කේ. ඩී. පී. ද සිල්වා මහතා 1970 මාර්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු රත්නපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාල සහකාර වශයෙන්.

එම්. රාජේන්ද්‍ර,
භාණ්ඩාගාරයේ ලේකම්.

1970 මාර්තු මස 19 වැනි දින,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේ දීය.

3-608

---

**1970 අංක 114**

පා 4/සාවි 14/134, පා 4/සාවි 7/49, පා 4/සාවි 3/116,
පා 4/සාවි 20/133, පා 4/සාවි 15/44, පා 4/සාවි 15/37,
පා 4/සාවි 2/38, පා 4/සාවි 2/101, පා 4/සාවි 20/163,
පා 4/සාවි 20/157, පා 4/සාවි 37/116, පා 4/සාවි 7/51,
පා 4/සාවි 16/83, පා 4/සාවි 28/134, පා 4/සාවි 12/41,
පා 4/සාවි 9/192.

## අධිකරණ ආඥාපනත

### 82 වන වගන්තිය යටතේ දැන්වීම

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක්සැන්ඩර් ෆේපයාර්ලි විජේමාන්න වන මම,

1. අබ්දුල් මජීඩ් මොහොමඩ් අලව්දීන් මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
2. හඳුන්ගේ උදේනිස් පෙරේරා මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
3. වීරවර්ණ කුරුකුලසූරිය බුසාබදුගේ වින්සන්ට් ප්‍රනාන්දු මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
4. අරුලම්පලම් සරවනමුත්තු මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
5. පේදුරු හේවගේ රිචඩ් ප්‍රේමරත්න මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
6. මාටින් වික්‍රමසිංහ මද්දනායක මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
7. චාල්ස් හෙන්රි ප්‍රනාන්දු මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ,
8. මාකලන්දගේ රෙජී රූපසිංහ මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
9. වල්ලිපුරම් තම්බාපිල්ලෙයි මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ,
10. ජේම්ස් ඉලංගකෝන් රාජරත්නම් මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
11. වෙදරාළලාගේ විජයවර්ධන මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
12. අලවි ජෙෆ්රි සහිඩ් මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
13. මානිස් ඩයස් ජයවර්ධන මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
14. රත්නායක මුදියන්සේලාගේ හිංගිරිබණ්ඩා මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
15. වැවේගෙදර පුංචි බණ්ඩා මහතා මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ,

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන ...

16. පිටවල කංකානමලාගේ ආතර් සිංඤෝ මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද, පත්කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

19670 මාර්තු 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

3-649

---

**1970 අංක 115**

දැනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ 2 වෙනි ශ්‍රේණියේ නිලධාරියෙකු වන රාසයියා සුබ්‍රමනියම් මහතා, 1970 පෙබරවාරි මස 5 වන දින සිට භාරකාර නිලධාරියෙකු වශයෙන් කට යුතු කිරීමට මහා භාරකාර ආඥපනත යටතේ ඇති 42අ රෙගුලාසිය අනුව මහා භාරකාර තැන විසින් පත්කර ඇති බවත්, එසේ කට යුතු කරන කාලය තුළ දී මහා භාරකාර තැන වෙනුවට ලියකියවිලි, වවුචර් ආදියට අත්සන් කිරීමට ඔහුට බලය දී තිබෙන බවත්, මහ ජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

1968 මැයි මස 3 වෙනි දින හා අංක 14,800 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1968. 4. 18 වන දින දරන අංක 174 දරණ දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

එල්. එච්. ආර්. පීරිස්,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 10 වන දා,
කොළඹ 12 දී ය.

3-528

---

**1970 අංක 116**

**නොතාරිස් ආඥාපණත (107 වන අධිකාරය)**

මර්වින් සමරවීර මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ මාර්තු මස 13 වැනි දින,
කොළඹ දීය.

3-686

---

**1970 අංක 117**

**නොතාරිස් ආඥාපණත (107 වන අධිකාරය)**

වෙල්ලප්පා වේලුප්පිල්ලේ විවේකානන්දන් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ මාර්තු මස 13 වැනි දින,
කොළඹ දීය.

3-685

---

## ආණ්ඩුවේ නිවේදන

ඊඞ 01/12/021.

එල්. ඞී.—ඞී. 7/63.

**1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත**

**6 (1) (V) වගන්තිය යටතේ ආඥාව**

1968 අංක 26 දරණ පනතින් සංශෝධිත, 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 6 (1) (V) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම, 1966 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය අනුව මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති එක් එක් ව්‍යාපාරය සඳහා ඉහත කී වගන්තිය අදාලවන බව, මෙම ආඥාවෙන් ප්‍රකාශ කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1970 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. අල්හම්බ්‍රා හොටේල්ස් ලිමිටඩ් මගින් පවත්වාගෙන යනු ලබන හොටෙල් අල්හම්බ්‍රා.

2. රේනුකා හොටේල්ස් ලිමිටඩ් මගින් පවත්වාගෙන යනු ලබන හොටෙල් රේනුකා.

3. සීපාරිස් ලිමිටඩ් මගින් පවත්වාගෙන යනු ලබන සීප්‍රාරිස් හොටෙල්.

4. හොටෙල් එයාර්වේස් (සිලෝන්) ලිමිටඩ් මගින් පවත්වාගෙන යනු ලබන හොටෙල් කැප්රි.

5. ලේඞිහිල් (නුවරඑළිය) හොටේල්ස් ලිමිටඩ් මගින් පවත්වාගෙන යනු ලබන ලේඞිහිල් නුවරඑළිය හොටෙල්.

3-640/1

---

ඊඞ 01/12/021

එල්. ඞී.—ඞී. 7/63.

**1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත**

**16 ඇ වගන්තිය යටතේ දැන්වීමයි**

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16 ඇ (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම, මෙහිවූ උපලේඛනයෙහි සඳහන් කෙරෙන ව්‍යාපාරය, ලංකාවේ ආර්ථික සංවර්ධනයට අත්‍යවශ්‍ය ව්‍යාපාර ලෙස සලකා, එකී ව්‍යාපාර දේශීය ආදායම් පනතේ 16 ඇ (1) වන වගන්තියේ කාර්යයන් සඳහා අනුමත කළ ව්‍යාපාර ලෙස මේ දැන්වීම මගින් ප්‍රකාශ කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1970 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. රේනුකා හොටේල්ස් ලිමිටඩ්.
2. අල්හම්බ්‍රා හොටේල්ස් ලිමිටඩ්.
3. ලේඞිහිල් (නුවරඑළිය) හොටේල්ස් ලිමිටඩ්.
4. සීපාරිස් ලිමිටඩ්.
5. හොටෙල් එයාර්වේස් (සිලෝන්) ලිමිටඩ්.

3-640/2

---

ඊඞ 01/12/021

එල්. ඞී.—ඞී. 7/63.

**1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත**

**68 අ වගන්තිය යටතේ දැන්වීම**

1968 අංක 26 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 68 අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම, මේ සමග මීට පහතින් දක්වෙන උපලේඛනයෙහි සඳහන් කෙරෙන ව්‍යාපාර ලංකාවේ ආර්ථික සංවර්ධනයට අත්‍යවශ්‍ය ව්‍යාපාර ලෙස සලකා 1966 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ ඉල්ලීම අනුව එකී ව්‍යාපාර දේශීය ආදායම් පනතේ 68 අ වගන්තියේ කාර්යයන් සඳහා අනුමත කළ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

යූ. බී. වන්නිනායක.
මුදල් ඇමති.

1970 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. රේනුකා හොටේල්ස් ලිමිටඩ්.
2. අල් හම්බ්‍රා හොටේල්ස් ලිමිටඩ්.
3. ලේ ඩිහිල් (ටුවරිස්ට්) හොටේල්ස් ලිමිටඩ්.
4. සීප්පාරිස් ලිමිටඩ්.
5. හොටෙල් එයාර්වේස් (සිලෝන්) ලිමිටඩ්.

3-640/3

---

ජිබ් 01/12/021

එල්. ඩී.—බී. 7/63.

## 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

### 6 (1) (VI) වගන්තිය යටතේ ආඥාව

1968 අංක 26 දරණ පනතින් සංශෝධනය කරන ලද 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 6 (1) (VI) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම, 1966 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය අනුව මෙම ආඥාව මගින් ඉහත කී පනතෙහි 6 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ V වැනි ඡේදයෙහි සඳහන් ව්‍යාපාරයෙහි ප්‍රයෝජනය සඳහා ගොඩනැගිලි සැපයීම පිළිබඳ ව්‍යාපාරයක් වන සිලෝන් එන්ටර්ටේන්මන්ට්ස් ලිමිටඩ් අනුමත කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1970 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

3-360/4

---

එල්.ඩී.–බී. 9/53

## කර්මාන්ත ශාලා ආඥාපනත

1961 අංක 54 දරණ පනතින් සංශෝධිත (128 වෙනි අධිකාරය වන) කර්මාන්ත ශාලා ආඥාපනතෙහි 50 වන හා 105 වන වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද්දාවූද, එකී 105 වන වගන්තිය යටතේ උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද්දාවූද නියෝග.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 මාර්තු මස 14 වන දින,
කොළඹ දීය.

### නියෝග

1. මෙම නියෝග 1969 කර්මාන්ත ශාලා (ප්‍රථමාධාර) නියෝග යනුවෙන් හැඳින්විය හැකිය.

2. 1961 අංක 54 දරණ කර්මාන්ත ශාලා (සංශෝධන) පනතින් සංශෝධිත (128 වැනි අධිකාරය වන) කර්මාන්ත ශාලා ආඥාපනතේ 126 වන වගන්තියෙන් විස්තර කර ඇති සියළුම කර්මාන්ත ශාලාවලට මෙම නියෝග අදාළ විය යුතුය.

3. කර්මාන්ත ශාලාවල තිබිය යුතු හා පවත්වාගෙන යා යුතු ප්‍රථමාධාර පෙට්ටි හෝ කුඩා අල්මාරි, පහත දක්වෙන තත්වයන්ට අනුකූල විය යුතුය :—

(1) යාන්ත්‍රික බලය ප්‍රයෝජනයට ගන්නාවුත් සේවයේ යොදවා සිටින අයගේ ගණන දහයට වැඩි නොවන්නාවුත් කර්මාන්ත ශාලා හෝ යාන්ත්‍රික බලය ප්‍රයෝජනයට නොගන්නාවූද, සේවයේ යොදවා ඇති අයගේ ගණන් පනහට වැඩි නොවන්නාවූද කර්මාන්තශාලා සම්බන්ධයෙන් වූ විට එක් එක් ප්‍රථමාධාර පෙට්ටියෙහි හෝ කුඩා අල්මාරියෙහි අඩු ගණනේ—

(i) විෂබීජ නසන ලද, තුවාල බඳින පටි (කුඩා) 6ක්,
(ii) විෂබීජ නසන ලද, තුවාල බඳින පටි (මධ්‍යම) 3ක්,
(iii) විෂබීජ නසන ලද, තුවාල බඳින පටි (විශාල) 3ක්,
(iv) විෂබීජ නසන ලද, පිළිස්සුම් තුවාල බඳින පටි (විශාල) 3ක්
(v) 1–1000 වතුර මිශ්‍රණය කරන ලද ඇක්‍රිෆේප්ලේවින් හයිඩ්‍රොක්ලෝරයිඩියම් අවුන්ස (හතරේ) බෝතල 1ක්,
(vi) පාවිච්චි කරන ප්‍රමාණය හා පිළිවෙල ලේබලයෙහි දක්වා තිබෙන ''සල් වොලටයිල්'' (අවුන්ස එකේ) බෝතල් 1ක්,
(vii) කතුරු 1ක්,
(viii) විෂබීජ නසන ලද කපු පුළුන් (අවුන්ස ½) පැකට් 3ක්,
(ix) අඟල් 1ක් පළල ඇලෙන පැලැස්තර රෝල් 1ක්,
(x) ඇස් සෝදන භාජන 1ක් සහ යෝග්‍ය වර්ගයක ඇස්සෝදන බෙහෙත් අවුන්ස හතරක්, සහ
(xi) කම්කරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ප්‍රථමාධාර පත්‍රිකාවේ පිටපතක්,

අඩංගු විය යුතුය.

(2) යාන්ත්‍රික බලය යොදවා ඇති, එමෙන්ම සේවයේ යොදවා ඇති අයගේ ගණන 10 ට වැඩි, එහෙත් 50 ට වැඩි නොවන කර්මාන්ත ශාලා සම්බන්ධයෙන් වූ විට, සෑම ප්‍රථමාධාර පෙට්ටියකම හෝ කුඩා අල්මාරියකම අඩු වශයෙන්—

(i) විෂබීජ නසන ලද, තුවාල බඳින පටි (කුඩා) 12ක්,
(ii) විෂබීජ නසන ලද, තුවාල බඳින පටි (මධ්‍යම) 6ක්,
(iii) විෂබීජ නසන ලද, තුවාල බඳින පටි (ලොකු) 6ක්,
(iv) විෂබීජ නසන ලද, පිළිස්සුම් තුවාල බඳින පටි (ලොකු) 6
(v) 1–1000 වතුර මිශ්‍රණය කරන ලද (අවුන්ස 4) ඇක්‍රිෆේලේවින් හයිඩ්‍රොක්ලෝරයිඩියම් බෝතල 1ක්,
(vi) පාවිච්චි කරන ප්‍රමාණය හා ක්‍රමය ලේබලයෙහි ලකුණු කරන ලද ''සල්වොලටයිල්'' (අවුන්ස 2) බෝතල 1ක්,
(vii) කතුරු 1ක්,
(viii) විෂබීජ නසන ලද කපු පුළුන් (අවුන්ස ½යේ) පැකට් 6ක්
(iv) අඟල් 2ක් පළල ඇලෙන පැලැස්තර රෝල් 1ක්,
(x) අඟල් 1ක් පළල ඇලෙන පැලැස්තර රෝල් 1ක්,
(xi) ඇස් සෝදන භාජන 1ක් සහ යෝග්‍ය වර්ගයක ඇස් සෝදන බෙහෙත් අවුන්ස හතරේ බෝතල 1ක් සහ
(xii) කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ප්‍රථමාධාර පත්‍රිකාවේ පිටපතක්

අඩංගු විය යුතුය.

(3) යාන්ත්‍රික බලය යොදවා ඇති හෝ නැති, පනස් දෙනෙකුට වඩා සේවයේ යොදවා ඇති කර්මාන්ත ශාලා සම්බන්ධයෙන් වූ විට, සෑම ප්‍රථමාධාර පෙට්ටියකම හෝ කුඩා අල්මාරියකම අඩු වශයෙන්—

(i) විෂබීජ නසන ලද, තුවාල බඳින පටි (කුඩා) 24ක්,
(ii) විෂබීජ නසන ලද, තුවාල බඳින පටි (මධ්‍යම) 12ක්,
(iii) විෂබීජ නසන ලද, තුවාල බඳින පටි (විශාල) 12ක්,
(iv) විෂබීජ නසන ලද, පිළිස්සුම් තුවාල බඳින පටි (විශාල) 12ක්,
(v) 1–1000 වතුර මිශ්‍රණය කරන ලද අවුන්ස් 8 ඇක්‍රිෆේප්ලේවින් හයිඩ්‍රොක්ලොරයිඩියම් බෝතල 1ක්,
(vi) පාවිච්චි කරන ප්‍රමාණය හා ක්‍රමය ලේබලයෙහි ලකුණු කරන ලද ''සල්වොලටයිල්'' (අවුන්ස 4) බෝතල් 1ක්,
(vii) කතුරු 1ක්,
(viii) විෂබීජ නසන ලද කපු පුළුන් (අවුන්ස ½) පැකට් 12ක්,
(ix) (අඟල් 4ක් පළල) අකුලන පැලැස්තර රෝල් 2ක්,
(x) අඟල් 4ක් පළල—අකුලන වෙළුම් පටි 12ක්,
(xi) අඟල් 2ක් පළල—අකුලන වෙළුම් පටි 12ක්,
(xii) අඟල් 1ක් පළල ඇති ඇලෙන පැලැස්තර රෝල් 1ක්,
(xiii) ඇස් සෝදන භාජන 2ක් සහ යෝග්‍ය වර්ගයක ඇස් සෝදන බෙහෙත් අවුන්ස හතරේ බෝතල 2ක්,
(xiv) තුන් හුලස් වෙළුම් පටි 6ක්,
(xv) ආරක්ෂක කටු පැකට් 2ක්,
(xvi) සුදුසු පතුරු සමූහයක්,
(xvii) ලේ නැවැත්වීම සඳහා අවශ්‍ය තිරිංග උපකරණයක්, සහ
(xviii) කම්කරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ප්‍රථමාධාර පිළිබඳ පත්‍රිකාවේ පිටපතක්

අඩංගු විය යුතුය.

(4) (අ) මනා ලෙස උපකරණ සපයා ඇති ගිලන් රථ කාමරයක් ඇති කර්මාන්ත ශාලාවල, හෝ

(ආ) යට කී ද්‍රව්‍ය අඩංගු එක් පෙට්ටියක්වත් යටත්පිරිසෙයින් දනට තිබෙන කර්මාන්ත ශාලාවල,

3(3) වන නියෝගයේ අංක : (ix) සිට (xvii) දක්වා වූ ද්‍රව්‍ය නියමිත වර්ගයේ ප්‍රථමාධා පෙට්ටියෙහි හෝ කුඩා අල්මාරියෙහි ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ.

4. එක් එක් ප්‍රථමාධාර පෙට්ටියෙහි හෝ කුඩා අල්මාරියෙහි පියනේ හෝ දෙරේ ඇතුල් පැත්තෙහි ඒ ප්‍රථමාධාර පෙට්ටියෙහි හෝ කුඩා අල්මාරියෙහි ඇති ද්‍රව්‍ය ලැයිස්තුවක් අලවා තැබිය යුතුය.

5. එක් එක් ප්‍රථමාධාර පෙට්ටියේ හෝ කුඩා අල්මාරියේ, සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් පැහැදිලි ලෙස ''ප්‍රථමාධාර'' යන වචනය සටහන් කළ යුතුය.

3–557

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ටී. ඩබ්ලිව්. හොෆ්මන් මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා රැකීරක්ෂා ඇමතිතුමන් විසින් උපාලි ඩයස් මහතා පත්කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. පී. තම්බයියා,
කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1970 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දීය.

3-553

---

## මංමාවත් ආඥාපනත

### 5 වැනි වගන්තිය යටතේ නියෝගය

මංමාවත් ආඥාපනතේ (193 වැනි පරිච්ඡේදය) 5 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමති, මොන්ටේගු ජයවික්‍රම වන මම, මේ සමග ඇති උපලේඛනයේ නිශ්චිත ලෙස සඳහන් කර ඇති අලුතින් තනන ලද වැලිගම අතුරු මාර්ගය මෙහි දැක්වෙන දිනයේ සිට ප්‍රසිද්ධ පාරක් ලෙස සැලකිය යුතු බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මොන්ටේගු ජයවික්‍රම,
රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1970. 3. 19 දින,
කොළඹ.

### උපලේඛනය

කොළඹ-ගාල්ල-මාතර මාර්ගයේ 87 1/2 සැතපුම් කණුව ළඟින් බෙදී ගොස්, එම මාර්ගයේ 90 1/4 සැතපුම් කණුව ළඟින් නැවත එකතු වන වැලිගම පිහිටි සැතපුම් 2.60 දිගින් යුත් එකී මාර්ග කොටසය.

3-722

---

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පණතේ 17 වැනි ඡේදය යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පහත සඳහන් අය 1970 මාර්තු මස 1 වෙනි දින සිට වර්ෂ 3 ක කාලයක් සඳහා පත් කිරීමට ගරු ජනසතු සේවා ඇමතිතුමා සතුටු වී ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ:—

1. කේ. අල්වාපිල්ලේ මහතා — අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති.
2. ඒ. සෙයිඩ් අහමඩ් මහතා — අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික.
3. ඒ. එම්. එස්. පෙරේරා මහතා — අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික.
4. තෝමස් වෛද්‍යරත්න මහතා — අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික.
5. ඩී. එස් ද සිල්වා මහතා — අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික.

ස්ථිර ලේකම්,
ජනසතු සේවා අමාත්‍යාංශය.

කොළඹ 1,
1970 මාර්තු 14 දින.

3-547

---

ඇල්. ඩී.—බී. 15/36.

## බන්ධනාගාර ආඥාපනත

### 35 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥාපනතෙහි 35 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ ඇමති ඇලෙක්සැන්ඩර් ෆේයාර්ලි විජේමාන්න වන මම, කොළඹ නව මැගසින් බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන්, 1970 පෙබරවාරි 26 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා, ඩී. ඒ. සෙනෙවිරත්න මහතා, දොස්තර එච්. ස්ටැන්ලි පීරිස් මහතා, දොස්තර ෂර්ලි එම්. පරණවිතාන මහතා සහ ජී. ඩේවිඩ් චන්ද්‍රසේන මහතා, මෙයින් පත් කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

3-570/1

---

ඇල්. ඩී.—බී. 15/36.

## බන්ධනාගාර ආඥාපනත

### 35 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥාපනතෙහි 35 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ ඇමති ඇලෙක්සැන්ඩර් ෆේයාර්ලි විජේමාන්න වන මම, වැලිකඩ බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන්, 1970 පෙබරවාරි 26 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා ඩබ්ලිව්. ප්‍රැන්සිස් ද සොයිසා මහතා, සී. ඒ. එල්. අභයරත්න මහතා, ඩී. ආර්. වික්‍රමරත්න මහතා සහ ක්ලෝඩා කිව්ලන් මහත්මිය මෙයින් පත් කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

3-570/2

---

අංකය : ඊඩී 26/010

## කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය

කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතන ආඥාපනතේ 7(2) හා 14 වැනි වගන්තිය යටතේ ගරු මුදල් ඇමතිතුමා විසින් 1970 මාර්තු 18 වෙනි දින සිට 1971 ජූනි මස 1 දින දක්වා වෛද්‍යාචාර්ය පී. ද එස්. විජේසේකර මහතා කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂ වරයෙක් වශයෙන් පත් කරන්ට යෙදී ඇත.

එච්. ආර්. ද සොයිසා,
මු./ලේ. වෙනුවට.

1970 මාර්තු 18 දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

3-648

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් ප්‍රදේශයන් තුළ එකී පනත ක්‍රියාත්මක විය යුතු යයි මෙයින් නිශ්චය කරමි.

ඇම්. එච්. ඇම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 මාර්තු මස 13 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

1. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි හාලිඇල සුළු නගර සභා ප්‍රදේශය.
2. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි යටියන්තොට සුළු නගර සභා ප්‍රදේශය.

3-569

## සමගි මණ්ඩල පනත

### 3 (2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමගි දයකයින්ගේ මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමගිදයකයින්ගේ මණ්ඩලයට පත් කළ යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ඒ වගන්තියේ (3) උප වගන්තිය යටතේ නිර්දේශයන් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඹාලයේ ඇති ආකෘතිපත්‍රය මගින් 1970 අප්‍රේල් 30 වන දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

ඇම්. එච්. ඇම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 මාර්තු මස 13 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

1. පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි මාම්පුරි ගම් ප්‍රදේශය.
2. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි නිර්වෙලි ගම් ප්‍රදේශය.
3. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි යටියන්තොට සුළු නගර සභා ප්‍රදේශය.
4. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි උඩුරුව කෝරලේ ගම් ප්‍රදේශය.
5. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කොලොන්නාව පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය.
6. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි මුල්ලේරියාව සුළු නගර සභා ප්‍රදේශය.
7. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි බෝගොඩ දකුණු ගම් ප්‍රදේශය.
8. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි හාලිඇල සුළු නගර සභා ප්‍රදේශය.

3-571

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, මොහොමඩ් හනීෆා මොහොම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූලි 4 දින අංක 14,861 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 1 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කොටිකාවත්ත සුළු නගර සභා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දයකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) අංගොඩ, කුඩා බුත්ගමුව, අංක 326 හි පදිංචි තලවතුගොඩගේ සයිමන් පෙරේරා මහතා.

(2) අංගොඩ, දෙල්ගහවත්ත, අංක 203 හි පදිංචි ඒම්ස් පෙරේරා අල්ගම මහතා.

(3) අංගොඩ, ගොතටුව, ගොතටුව හන්දිය, අංක 358 හි පදිංචි රණසිංහ වීරක්කොඩිගේ රිචඩ් පෙරේරා මහතා.

(4) අංගොඩ, ගොතටුව, අංක 402, “ සිරි සෙවන ” හි පදිංචි මාලින්බඩ වික්‍රමසිංහගේ මනුවෙල් පෙරේරා මහතා.

(5) අංගොඩ, තල්ගහවත්ත, අංක 6 හි පදිංචි ලියනගේ දොන් මිත්‍රපාල මහතා.

(6) අංගොඩ, ගොතටුව, ගොඩවෙල, අංක 27/1, “ ජයතුර ” හි පදිංචි මෙත්තා සෝමවීර රූපසිංහ ජයවර්ධන මහතා.

(7) රාජගිරිය, මාදින්නාගොඩ, අංක 742 හි පදිංචි රාජපක්ෂ පතිරගේ මිලන් පෙරේරා මහතා.

(8) වැල්ලම්පිටිය, කිත්තම්පහුව, අංක 115, “ පුෂ්පකාන්ති ” හි පදිංචි ලියන ආරච්චිගේ ජේම්ස් මහතා.

(9) වැල්ලම්පිටිය, කොටුවිල, උස්වත්ත, අංක 240 හි පදිංචි පෙරුම්බඩගේ සරනේලිස් මහතා.

(10) වැල්ලම්පිටිය, කොටුවිල, අංක 282 හි පදිංචි කැකුලාවල ආරච්චිගේ සෝමපාල ජයවර්ධන මහතා.

(11) වැල්ලම්පිටිය, කොහිලවත්ත, අංක 78/1 හි පදිංචි ලියනගේ සෝමදාස පෙරේරා මහතා.

(12) අංගොඩ, කුඩා බුත්ගමුව, අංක 30 හි පදිංචි පුළුක්කුට්ටි ආරච්චිගේ සේපා මුණසිංහ පෙරේරා මහතා.

(13) අංගොඩ, කොටිකාවත්ත, ශීලානන්ද මාවත, අංක 262 හි පදිංචි මද්දුමාගේ ලුවිස් පෙරේරා මහතා.

(14) අංගොඩ, ගොතටුව, අංක 935 හි පදිංචි බුලත්සිංහලගේ කුලරත්න කුරේ මහතා.

(15) අංගොඩ, කොටිකාවත්ත, වැලිකඩ පාර, අංක 120 හි පදිංචි හේරත් මුදියන්සේලාගේ උක්කු බණ්ඩා කරුණාරත්න මහතා.

(16) අංගොඩ, ගොතටුව, පොල්කන්දවත්ත, අංක 511 හි පදිංචි කොස්වත්ත ලියනගේ සිරිල් පෙරේරා මහතා.

(17) රාජගිරිය, මාදින්නාගොඩ, අංක 764 හි පදිංචි අහන්ගම ලියනගේ සිරිසේන මහතා.

(18) අංගොඩ, ගොතටුව, කජුගහවත්ත, අංක 75 හි පදිංචි ගාමිණී මාටින් විදානරත්න මහතා.

(19) අංගොඩ, ගොතටුව, බෝපැත්ත, අංක 313, “ රණනිවස ” හි පදිංචි දොන් කීර්තිපාල රණසිංහ මහතා.

(20) වැල්ලම්පිටිය, මෙගොඩ කොලොන්නාව, අංක 264 හි පදිංචි නාලවත්තගේ සුරවීර පින්තු සේනානායක මහතා.

(21) අංගොඩ, ගොතටුව, ගොතටුව හන්දිය, “ සිට්විච් ” හි පදිංචි බටුවත්ත ගමගේ විමලසිරි ද සිල්වා මහතා.

(22) වැල්ලම්පිටිය, කිත්තම්පහුව, අංක 82 හි පදිංචි පූකාර ගාල්ලගේ සෝමරත්න පෙරේරා මහතා.

(23) වැල්ලම්පිටිය, කිත්තම්පහුව, ගෝතමී මාවත, අංක 281/1 හි පදිංචි කොඩිකාරගේ කුමතේරිස් අප්පුහාමි මහතා.

(24) අංගොඩ, කුඩා බුත්ගමුව, අංක 139, “වසන්ත” හි පදිංචි කලු ආරච්චිගේ ජයතිස්ස පෙරේරා මහතා.

(25) අංගොඩ, මහ බුත්ගමුව, අංක 206, “ යමුනා ” හි පදිංචි දොන් රොකුස් කස්තුරි ආරච්චි මහතා.

(26) අංගොඩ, මහ බුත්ගමුව, අංක 152 හි පදිංචි පතිරගේ විලියම් පීටර් පෙරේරා මහතා.

(27) අංගොඩ, කොටිකාවත්ත, සමගි මාවත, අංක 212 හි පදිංචි මහවිල පටබැඳිගේ විනී රුද්‍රිගු මහතා.

(28) අංගොඩ, ගොතටුව, අංක 615 හි පදිංචි කොට්ගලගේ බාරොන් පෙරේරා මහතා.

(29) අංගොඩ, මහ බුත්ගමුව, අංක 140, “ සිරි නිවස ” හි පදිංචි පනාගොඩගේ බාරොන් පෙරේරා මහතා.

(30) අංගොඩ, කොහිලවත්ත, “ කැලුම් ” හි පදිංචි කැකුලාවල ආරච්චිගේ සුගතදාස ජයවර්ධන මහතා.

(31) අංගොඩ, ගොතටුව හන්දිය, අංක 358 හි පදිංචි රණසිංහ වීරක්කොඩිගේ රිචඩ් පෙරේරා මහතා.

(32) අංගොඩ, ගොතටුව, අංක 225/2 හි පදිංචි මහප්පු ආරච්චිගේ දොන් බේලින් අප්පුහාමි මහතා.

(ආ) අංගොඩ, කුඩා බුත්ගමුව, අංක 326 හි පදිංචි තලවතුගොඩගේ සයිමන් පෙරේරා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

ඇම්. එච්. ඇම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 මාර්තු මස 13 වන දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

3-572

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1965 ඔක්තෝබර් 8 වැනි දින අංක 14,529 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 14 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ නාරන්තනෙයි ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) කයිට්ස්, නැගෙනහිර කරම්පන්, අංක 10 දරණ කොට්ඨාශයේ පදිංචි සුප්පයියා කතිරිතම්බි මහතා.

(2) කයිට්ස්, උතුර නාරන්තනයි පදිංචි සින්නතම්බි වයිරමුත්තු මහතා.

(3) කයිට්ස්, නැගෙනහිර කරම්පන්, අංක 11 දරණ කොට්ඨාශයේ පදිංචි සුප්පයියා රාමසාමි මහතා.

(4) කයිට්ස්, දකුණු නාරන්තනයි, රාජමල්ලිකා පදිංචි සන්තියාපිල්ලයි ක්සේවියර් පිරාන්සිස් මහතා.

(5) කයිට්ස්, උතුර නාරන්තනයි පදිංචි නාගනාපිල්ලයි කන්දසාමි මහතා.

(6) කයිට්ස්, බටහිර කරම්පන් පදිංචි විනාසිතම්බි පෙරිය තම්බි මහතා.

(7) කයිට්ස්, පුලියන්කුඩල් පදිංචි නාගලිංගම් කන්තප්පු මහතා.

(8) කයිට්ස්, පුලියන්කුඩල් පදිංචි සින්නයියා කුරුසාමි මහතා.

(9) කයිට්ස්, බටහිර කරම්පන්, අංක 13 දරණ කොට්ඨාශයේ පදිංචි රාමලිංගම් කන්තයියා මහතා.

(10) කයිට්ස්, කරම්පන්, අංක 13 දරන කොට්ඨාශයේ පදිංචි ඇස්. මනුවෙල් පිල්ලයි රිඩ්ජ්වේ මහතා.

(11) කයිට්ස්, බටහිර නාරන්තනයි, පදිංචි වීරමුත්තු සුබ්‍රමනියම් මහතා.

(12) කයිට්ස්, උතුර නාරන්තනයි පදිංචි සින්නතම්බි සුප්පයියා මහතා.

(13) කයිට්ස්, උතුර නාරන්තනයි පදිංචි සින්නප්පු තුරයියප්පා මහතා.

(14) කයිට්ස්, උතුර නාරන්තනයි පදිංචි අයියම්පිල්ලයි සින්නතුරයි මහතා.

(15) කයිට්ස්, නාරන්තනයි, 9 වෙනි සැතපුම් කණුව අසල පදිංචි බස්ටියම්පිල්ලයි මනවේට්පිල්ලයි මහතා.

(16) කයිට්ස්, උතුර නාරන්තනයි පදිංචි නාගලිංගම් විසුව ලිංගම් මහතා.

(17) කයිට්ස්, උතුර නාරන්තනයි පදිංචි නාගලිංගම් නඩරාජා මහතා.

(18) වේලනයි, බටහිර සරවනයි, අංක 2 දරණ කොට්ඨාශයේ පදිංචි පොන්නම්බලම් සුබ්‍රමනියම් මහතා.

(19) වේලනයි, බටහිර සරවනයි, අංක 2 දරණ කොට්ඨාශයේ පදිංචි කනපතිපිල්ලයි තම්පාපිල්ලයි මහතා.

(20) කයිට්ස්, සුරුවිල් පාර, අංක 5 දරණ කොට්ඨාශයේ පදිංචි සින්නතම්බි පොන්නුච්චාමි මහතා.

(21) කයිට්ස්, දකුණ පුලියන්කුඩල්, අංක 4 දරන කොට්ඨාශයේ පදිංචි සුප්පයියා කන්තයියා මහතා.

(22) කයිට්ස්, දකුණ පුලියන්කුඩල්, අංක 4 දරණ කොට්ඨාශයේ පදිංචි කාර්තිකේසු බාලක්‍රිෂ්ණන් නොහොත් ක්‍රිෂ්ණපිල්ලයි මහතා.

(23) කයිට්ස්, උතුර නාරන්තනයි, අංක 6 දරන කොට්ඨාශයේ පදිංචි කතිර්වේලු ත්‍යාගරාජා මහතා.

(24) කයිට්ස්, උතුර නාරන්තනයි, අංක 6 දරණ කොට්ඨාශයේ පදිංචි තාමෝතරම්පිල්ලයි තිරුඥානසම්බන්ධ මූර්ති මහතා.

(25) කයිට්ස්, දකුණ නාරන්තනයි, අංක 8 දරණ කොට්ඨාශයේ පදිංචි අලේසු සන්තියෝකු මහතා.

(26) කයිට්ස්, නාරන්තනයි, පණ්නයි පාර, අංක 7 දරණ කොට්ඨාශයේ පදිංචි මරුතයිනාර් කන්තයියා මහතා.

(27) කයිට්ස්, නාරන්තනයි, අංක 8 දරණ කොට්ඨාශයේ පදිංචි තම්බිමුත්තු සහාරත්නම් මහතා.

(28) කයිට්ස්, කරම්පන්, අංක 11 දරණ කොට්ඨාශයේ පදිංචි සවරිමුත්තු නිකලස් මහතා.

(29) කයිට්ස්, කරම්පන්, අංක 10 දරණ කොට්ඨාශයේ පදිංචි නිකුලා පිල්ලයි අන්තෝනි පිල්ලයි මහතා.

(30) කයිට්ස්, කරම්පන්, පරුත්තියඩයිප්පු, අංක 12 දරණ කොට්ඨාශයේ ඉලයතම්බි කුලන්තයිවේලු මහතා.

(31) කයිට්ස්, දකුණ කරම්පන්, අංක 13 දරණ කොට්ඨාශයේ පදිංචි කන්තයියා ෂන්මුගනාතන් මහතා.

(32) වේලනයි, සරවනයි, අංක 1 දරණ කොට්ඨාශයේ පදිංචි රාමලිංගම් නාගුලේසුපිල්ලයි මහතා.

(33) වේලනයි, සරවනයි, අංක 2 දරණ කොට්ඨාශයේ පදිංචි කුමාරවේලු පත්මනාදන් මහතා.

(34) වේලනයි, සරවනයි, අංක 2 දරණ කොට්ඨාශයේ පදිංචි වේලායුතම් සාම්බසිවම් මහතා.

(35) කයිට්ස්, පුලියන්කුඩල්, අංක 3 දරණ කොට්ඨාශයේ පදිංචි සෙල්ලයියා සිට්ටම්පලම් මහතා.

(36) වේලනයි, සරවනයි, අංක 1 දරණ කොට්ඨාශයේ පදිංචි කාර්තිකේසු අරුණාසලම් මහතා.

(ආ) කයිට්ස්, නැගෙනහිර කරම්පන්, අංක 10 දරණ කොට්ඨාශයේ පදිංචි සුප්පයියා කතිරිතම්බි මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්.

1970, මාර්තු මස 13 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

3-573

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති, මහබාලගේ දොන් හෙන්රි ජයවර්ධන වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. ඩී. එච්. ජයවර්ධන,
විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති.

1970 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.
කොද අත් ශා 1/62

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පිලියන්දල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ තෙලවල ග්‍රාමයේ තෙලවල පිහිටි ලේඩි කැතරින් වතුයායෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 35 ක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : තෙලවල පාර සහ ගම්මුන්ගේ ඉඩම් ;

නැගෙනහිරට : රාජකරුණා, ඩී. ඒ. ප්‍රනාන්දු මහත්වරුන්ට අයිති ඉඩම් සහ ගම්මුන්ගේ ඉඩම් ;

දකුණට : ලේඩි කැතරින් මොඩල් වතුන් පාර සහ ගම්මුන්ගේ ඉඩම් ;

බස්නාහිරට : ගාලු පාර.

3-574

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති, මහබාලගේ දොන් හෙන්රි ජයවර්ධන වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. ඩී. එච්. ජයවර්ධන,
විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති.

1970 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.
කොද අත් ශා 1/62

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පිලියන්දල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ තෙලවල ග්‍රාමයේ තෙලවල පිහිටි ලේඩි කැතරින් වතුයායෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 10 ක පමණ ඉඩම් කෙටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ;

නැගෙනහිරට : ගම්මුන්ගේ ඉඩම් ;

දකුණට : තෙලවල පාර ;

බස්නාහිරට : අයි. සී. අයි. පැක්ටරිය.

3-568

## ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

### ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලය—නුගේගොඩ

**1964 ඔක්තෝබර් 1 දින සිට 1965 සැප්තැම්බර් 30 දින දක්වා වූ වර්ෂය සඳහා ආදයම් සහ වියදම් ගිණුම**

| 1963–64 රු. | ශ. | වියදම | ඇස්තමේන්තු මුදල රු. | රු. | ශ. |
|---|---|---|---|---|---|
| 12,35,592 | 88 | වැටුප් හා දීමනා ... | 14,28,015 ... | 12,24,792 | 57 |
| 82,931 | 78 | අර්ථසාධ අරමුදලට දයක මුදල් ... | 1,00,000 ... | 86,325 | 10 |
| 2,302 | 99 | සංග්‍රහ වියදම් ... | 2,000 ... | 1,696 | 96 |
| 10,749 | 28 | ගමන් වියදම් ... | 5,000 ... | 8,293 | 67 |
| — | | නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර | 35,000 ... | 4,291 | 51 |
| 11,355 | 20 | වාහන නඩත්තු ... | 5,000 ... | 11,529 | 57 |
| 3,100 | 36 | රක්ෂණ වියදම් ... | 4,000 ... | 644 | 02 |
| 26,784 | 04 | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ වියදම් ... | 27,000 ... | 29,852 | 73 |
| 16,731 | 17 | දුරකතන හා තැපැල් වියදම් | 12,000 ... | 16,145 | 91 |
| 6,841 | 58 | විදුලිය හා ජලය ... | 20,000 ... | 10,118 | 31 |
| 81,243 | 60 | ශිෂ්‍යාධාර ... | 82,000 ... | 80,714 | 50 |
| 8,809 | 19 | දැන්වීම් ගාස්තු ... | 9,000 ... | 12,408 | 75 |
| 1,34,322 | 24 | විභාග වියදම් ... | 1,00,000 ... | 2,23,792 | 39 |
| 6,000 | 0 | ගණන් පරීක්ෂක ගාස්තු ... | 7,000 ... | 7,000 | 0 |
| 12,377 | 25 | අනියම් වියදම්—විද්‍යාගාර සුළු වැය ඇතුළත් ... | 3,000 ... | 6,084 | 97 |
| 20,484 | 22 | ගබඩා වියදම් ... | 3,000 ... | 10,882 | 47 |
| 468 | 30 | ගොඩනැගිලි අලුත් වැඩියා කිරීම ... | 5,000 ... | 2,828 | 17 |
| 397 | 50 | පර්යේෂණ ... | — ... | — | |
| 1,620 | 0 | ශිෂ්‍ය සමිති ආධාර ... | — ... | 1,600 | 0 |
| 1,038 | 01 | ශිෂ්‍ය ශුභසාධක වියදම් ... | 1,000 ... | 400 | 0 |
| 830 | 0 | බිහි වැඩ ... | 1,000 ... | — | |
| 3,069 | 80 | බැංකු ගාස්තු ... | 5,000 ... | 4,338 | 44 |
| 3,407 | 91 | උපාධි ප්‍රදානෝත්සව වියදම් | 5,000 ... | 2,297 | 03 |
| 3,386 | 20 | සේවක නිල ඇඳුම් ... | 2,700 ... | 2,670 | 35 |
| 207 | 50 | නීතිවේදි වැය ... | 1,000 ... | 5,447 | 50 |
| 6,736 | 12 | ශිෂ්‍ය නිවාසයේ ආදයමට වැඩි වියදම් ... | — ... | 21,299 | 32 |
| 10,700 | 83 | නැව් ගාස්තු ... | 9,000 ... | 3,573 | 34 |
| 3,000 | 0 | ඇඳුම් පැළඳුම් ... | 1,300 ... | 1,800 | 0 |
| 908 | 67 | ඉගැන්වීමේ ගාස්තු ... | 5,000 ... | 4,296 | 96 |
| 1,401 | 04 | පුවත්පත් හා සඟරා ... | 1,000 ... | 1,262 | 74 |
| | | අතිකාල දීමනා ... | 1,000 ... | 1,938 | 77 |
| | | වෛද්‍ය මධ්‍යස්ථාන සුළු වැය | 1,000 ... | 827 | 82 |
| | | විශ්ව විද්‍යාලයීය සංග්‍රහය ... | 3,000 ... | 250 | 0 |
| | | පර්යේෂණ හා පරිවර්තන ආධාර ... | 10,000 ... | — | |
| | | පරිවර්තන හා ප්‍රකාශන ... | 2,000 ... | 1,000 | 0 |
| | | බලාපොරොත්තු නොවන සේවා ... | 2,000 ... | — | |
| 55,449 | 14 | ක්ෂයය ... | — ... | 58,080 | 60 |
| 1,077 | 87 | වියදමට වැඩි ආදයම ... | — ... | 23,090 | 67 |
| 17,53,324 | 67 | | 18,98,015 | 18,71,575 | 14 |

| 1963–64 රු. | ශ. | ආදයම | ඇස්තමේන්තු මුදල රු. | රු | ශ. |
|---|---|---|---|---|---|
| 16,00,000 | 0 | පුනරාවර්තන ආධාර ... | 16,93,838 ... | 16,93,838 | 0 |
| 54,550 | 0 | ලේඛ්‍යාරූඪවීමේ ගාස්තු | 50,000 ... | 66,842 | 0 |
| 69,835 | 0 | විභාග ගාස්තු ... | 60,000 ... | 82,322 | 55 |
| 5,586 | 15 | මුද්‍රිත ග්‍රන්ථ විකිණීම (ප්‍රකාශන) ... | 7,000 ... | 5,434 | 60 |
| 7,722 | 44 | මිශ්‍ර ආදයම ... | 3,000 ... | 10,912 | 36 |
| 9,694 | 0 | නිවාස කුලී ... | 9,000 ... | 9,628 | 27 |
| 5,937 | 08 | ණය පොලී ... | — ... | 2,597 | 36 |
| 17,53,324 | 67 | | 18,22,838 | 18,71,575 | 14 |

පී. යුබසිංහ,
ගණකාධිකාරී.

ඊ. නාගොඩවිතාන,
ලේකම්.

ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලය,
නුගේගොඩ, 1970.3.5.

## ශ්‍රීලංකා විද්‍යෝදයවිශ්ව විද්‍යාලය—නුගේගොඩ

### 1965 සැප්තැම්බර් 30 දට ශේෂ පත්‍රය

**බැරකම්**

| 1963/64 | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| | **රජයේ ආධාර** | | | |
| | 1964.9.30 දක්වා රජයේ ආධාර ... | 1,54,23,087 0 | | |
| | 64/65 වර්ෂයේ රජයේ ආධාර ... | 22,48,838 0 | | |
| | | | 17,671,925 0 | |
| | **ප්‍රාග්ධන ගිණුම** | | | |
| 67,07,600 85 | ... 1964.9.30 දක්වා රජයෙන් ලැබුණු මූලධන ආධාර | 88,07,600 85 | | |
| 21,00,000 0 | ... 1964/65 වර්ෂයට ලැබුණ මූලධන ආධාර ... | 5,55,000 0 | | |
| 88,07,600 85 | | | 93,62,600 85 | |
| | **අතිරික්තය** | | | |
| 97,622 63 | ... 1964.9.30 දක්වා ඉතිරි ... ... | 98,700 50 | | |
| 1,077 87 | ... 1964/65 වර්ෂයේ වියදමට වඩා ආදායම ... | 23,090 67 | | |
| | පසුගිය වර්ෂවල ඉතිරි ප්‍රකාශන වටිනාකම ... | 35,632 69 | | |
| | | | 1,57,423 86 | |
| | | | | 95,20,024 71 |
| | **වෙනත් බැරකම්** | | | |
| 2,20,501 05 | ... විවිධ ණය හිමියෝ ... ... | | 3,27,602 06 | |
| 20,400 0 | ... පුස්තකාල තැන්පත් මුදල් ... ... | | 23,660 0 | |
| 1,190 0 | ... ටැන්ඩර් තැන්පත් මුදල් ... ... | | 8,944 0 | |
| 510 50 | ... විද්‍යා තැන්පත් මුදල් ... ... | | 1,170 50 | |
| | තැන්පත් මුදල්—වෙනත් ... ... | | 5,743 36 | |
| 706 85 | ... ශිෂ්‍ය සමිති දයක මුදල් ... ... | | 8,621 40 | |
| | ශිෂ්‍යත්ව අරමුදල (හේවාවිතාරණ සහ අභය ආර්යසිංහ) | | 315 0 | |
| | | | | 3,76,056 32 |
| 91,49,609 75 | | | | 98,96,081 03 |

**වත්කම්**

| 1963/64 | ස්ථාවර වත්කම් | වත්කම ක්ෂයය රු. ශ. | ක්ෂයය රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| 7,11,034 37 | ... ඉඩම් ... ... | | | | 8,02,826 12 |
| | ක්‍රීඩා පිට්ටනිය ... ... | | | | 5,756 39 |
| 2,31,371 34 | ... ඥානෙශ්වර ශාලාව ... | 2,48,416 69 | 22,667 34 | 2,25,749 35 | |
| 1,68,637 02 | ... විනෙතෘ මන්දිරය ... | 1,72,961 05 | 8,539 96 | 1,64,421 09 | |
| 1,26,274 64 | ... මුද්‍රණාල ගොඩනැගිල්ල ... | 1,31,985 15 | 9,367 38 | 1,22,617 77 | |
| | | | | | 5,12,788 21 |
| 69,498 40 | ... ජල සම්පාදනය ... ... | 1,36,835 64 | 888 79 | | 1,35,946 85 |
| 2,21,559 10 | ... දූව බඩු ... ... | 2,91,559 30 | 80,051 21 | 2,11,508 09 | |
| 1,30,848 81 | ... උපකරණ ... ... | 1,56,831 26 | 29,334 68 | 1,27,496 58 | |
| 1,55,227 38 | ... විද්‍යා උපකරණ ... | 2,07,935 64 | 25,207 40 | 1,82,728 24 | |
| | ක්‍රීඩා භාණ්ඩ සහ උපකරණ ... | | | 4,363 0 | |
| | | | | | 5,26,095 91 |
| 27,500 44 | ... රථ වාහන ... ... | 53,824 82 | 29,074 42 | | 24,750 40 |
| 16,434 50 | ... උපාධි ඇඳුම් ... ... | 24,880 10 | 5,323 26 | | 19,556 84 |
| 53,48,362 63 | ... ගොඩනැගිලි (නොනිමි) ... | | | | 60,14,845 93 |
| 5,675 0 | ... දුරකථන මාර්ගය... ... | | | | 5,675 0 |
| 3,29,236 07 | ... පුස්තකාල පොත් ... | | | | 4,04,193 85 |
| | මුද්‍රණ යන්ත්‍ර ... ... | | | | 33,781 05 |
| | **ජංගම වත්කම්** | | | | |
| 7,34,386 07 | ... විවිධ ණය ගැතියෝ ... | | | 1,02,130 18 | |
| 43,864 31 | ... ආපද ණය ගැතියෝ ... | | | 47,978 29 | |
| 7,070 0 | ... උත්සව පූර්ව දීමනා ... | | | 6,562 50 | |
| | | | | | 1,56,670 97 |
| 36,354 45 | ... දූව ගිණුම ... ... | | | 30,345 84 | |
| | ප්‍රකාශන තොග ගිණුම ... | | | 35,632 69 | |
| | | | | | 65,978 53 |
| 620 0 | ... අත්තිකාරම් මුදල් — වෙනත් ... | | | | 2,760 0 |
| 1,32,024 16 | ... ස්ථිර තැන්පත් ගිණුම ... | | | | 6,01,892 01 |
| 2,03,375 24 | ... බැංකුවේ ඉතිරි මුදල් අංක I ... | | | 1,06,856 21 | |
| 4,48,309 27 | ... බැංකුවේ ඉතිරි මුදල් අංක II ... | | | 4,75,706 76 | |
| | | | | | 5,82,562 97 |
| 1,000 0 | ... අතේ ඉතිරි මුදල | | | | |
| 946 55 | ... බැංකුවේ තැන්පත් නොකළ මුදල් ඇනවුම් | | | | |
| 91,49,609 75 | | | | | 98,96,081 03 |

ශ්‍රී ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලය,
නුගේගොඩ,
1968.8.20.

පී. සුබසිංහ,
ගණකාධිකාරී.

ඊ. නාගොඩවිතාන,
ලේකම්.

1958 අංක 45 දරන විද්‍යොදය විශ්ව විද්‍යාලය සහ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය පනතේ 45 දරන වගන්තිය ප්‍රකාර, 1965 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වූ වර්ෂය සඳහා ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලයේ ගිණුම් මගේ විධානය යටතේ පරීක්ෂා කරන ලදී.

මීට අමුනා ඇති අංක කිව්කිව්—1/අ/75 හා 1968 දෙසැම්බර් මස 31 වන දින දරන මගේ වාර්තාවේ නිරීක්ෂණයන්ට යටත්ව මෙහි ඉහත දක්වා ඇති ශේෂ පත්‍රය සහ ඒ හා සම්බන්ධිත මුදල් ප්‍රකාශයන් 1965 සැප්තැම්බර් 30 වැනි දිනට ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලයේ මුදල් තත්ත්වය සහ එම දිනෙන් ගෙවී ගිය වර්ෂය තුලදී එහි වැඩ කටයුතු කරගෙන යාමෙන් ලත් ප්‍රතිඵල සාධාරන ලෙස පිළිබිඹු වන සේ සකස් කොට ඇති බව මගේ හැඟීමයි.

1968 දෙසැම්බර් මස 31 වන දින,
කොළඹ 7, රජයේ ගණන් පරීක්ෂණ කාර්යාලයේදීය.
3-535

ඒ. ගුණනායගම්,
ඔඩිටර් ජනරාල් වෙනුවට.

**1965 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වූ වර්ෂය සඳහා ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ ඔඩිටර් ජනරාල්වරයාගේ වාර්තාව**

(මෙහි සඳහන් මුදල් ගණන්වල ශත ගණන් ආසන්න රුපියලට හරවා ඇත.)

1958 අංක 45 දරන විද්‍යොදය විශ්වවිද්‍යාලය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය පනතේ 45 වැනි වගන්තිය ප්‍රකාර 1965 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වූ වර්ෂය සඳහා ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලයේ ගිණුම් මාගේ විධානය යටතේ ගණන් පරීක්ෂණයට භාජනය කරන ලදී.

1965 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් ප්‍රකාශයන් ගණන් පරීක්ෂාවට ලැබුනේ 1966 ඔක්තෝබර් 2 වන දින දී ය. එහෙත් ගණන් පරීක්ෂණයේ දී පෙන්වා දෙන ලද වැරදි නිසාවෙන් ඒවා සංශෝධනය කරන ලදුව, යට සඳහන් සංශොධිත ගිණුම් ප්‍රකාශයන් ගණන් පරීක්ෂණයට ලැබුනේ 1968 අගෝස්තු 24 වන දී ය.

(අ) 1965 සැප්තැම්බර් 30 වන දින ශේෂ පත්‍රය ;

(ආ) 1965 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වූ වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම ;

(ඇ) 1965 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වූ වර්ෂය සඳහා වූ ශිෂ්‍ය නිවාසයේ ආදායම් සහ වියදම් ගිණුම.

ගණන් පරීක්ෂණයේ දී පෙනී ගිය කරුණු පහත දැක්වේ ;—

**2. ගිණුම් ප්‍රතිඵල :**

මූලධන ප්‍රදානය හැරුණු විට වර්ෂය තුල දී රජයෙන් ලැබුන ප්‍රදානය රුපියල් 16,93,838 ක් වූ අතර අනිකුත් මාර්ග වලින් ලැබුන ආදායම රුපියල් 1,77,737 ක් වුයෙන් වර්ෂය තුල මුළු ආදායම රුපියල් 18,71,575 ක් විය. මූලධන වියදම හැරුණු විට අනිකුත් වියදම් රුපියල් 18,48,484 ක් වුයෙන් වර්ෂය තුල වියදමට වඩා රුපියල් 23,091 ක අතිරික්තයක් ඇති විය.

පොදු කායඹයන් සඳහා දෙන ලද මෙම රුපියල් 16,93,838 ක ප්‍රදානය හැරුණු විට වර්ෂය තුල දී රජය විසින් රුපියල් 5,55,000 ක මූලධන ප්‍රදානයක් ද කැරුණි.

**ශේෂ පත්‍රය**

**3. ස්ථාවර වත්කම්—රු. 84,86,227 :**

ස්ථාවර වත්කම්වල විස්තර දැක්වෙන ක්‍රමවත් ලේඛන තබා ගෙන නොතිබුනි.

**4. ඉඩම්—රු. 8,02,826 :**

ඉඩම් පවරා ගැනීමේ ආඥපනත යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා 1960–61 සිට 1964–65 වර්ෂයන් තුල දී වරින්වර කොළඹ, අතිරේක දිසාපතිවරයාට ගෙවන ලද මුදල්වල එකතුව මින් පෙන්නුම් කෙරේ.

විශ්ව විද්‍යාලය නමට පවරා ගැනීමේ නියෝග 1968 නොවැම්බර් 30 දින වන තුරුත් ලැබී නොතිබුනි.

**5. ක්‍රීඩා පිට්ටනිය—රු. 5,756 :**

විශ්ව විද්‍යාලයීය බිම් කොටසක් ක්‍රීඩා පිට්ටනිය වශයෙන් පාවිච්චි කිරීම සඳහා සමතලා කිරීමට ගිය වියදම මින් පෙන්නුම් කෙරේ. එහෙත් ඉඩමෙහි වටිනාකම " ඉඩම් " යටතේ පෙන්වා ඇති රුපියල් 8,02,826 ක මුදලෙහි ඇතුලත් කොට ඇත.

**6. ගොඩනැගිලි—රු. 5,12,788 :**

ගොඩනැගිලි වෙනුවෙන් වැයව ගෘහ නිර්මාන ශිල්පි ගාස්තු රුපියල් 5,12,788 ක මුදලෙහි ඇතුලත් නොවේ. නිම කරන ලද හා නිම නොකරන ලද ගොඩනැගිලි වෙනුවෙන් 1965 සැප්තැම්බර් 30 දක්වා ගෘහ නිර්මාන ශිල්පි ගාස්තු වශයෙන් වියදම් වූ රුපියල් 2,66,123 ක මුදලක් ශේෂ පත්‍රයේ " ගොඩනැගිලි (නොනිමි) " යටතේ පෙන්වා ඇති රුපියල් 60,14,846 ක මුදලෙහි ඇතුලත් කොට ඇත. මගේ විමසීමට පිළිතුරු සැපයීමේ දී, නිම කරන ලද ගොඩනැගිලි වෙනුවෙන් ගෙවූ ගෘහ නිර්මාන ශිල්පි ගාස්තු ගොඩනැගිලි ගිණුමට මාරු කිරීමට ලේකම් එකඟ විය.

**7. විද්‍යා උපකරණ—රු. 1,82,728 :**

නිත්‍ය විද්‍යා උපකරණ පමණක් නොව ප්‍රාග්ධන ගත නොකළ යුතුව තිබූ පාරිභොජ්‍ය විද්‍යා බඩු බාහිරාදිය ද මෙහි ඇතුළත් වේ.

**8. ජලසම්පාදනය—රු. 1,35,947 :**

විශ්වවිද්‍යාලයේ ජලස්ථම්භයට 6″ ක විෂ්කම්භයක් ඇති ජල නලයක් සවිකිරීම සඳහා 1965 අගෝස්තු මාසයේ දී ජලසම්පාදන සහ ජලප්‍රවාහන අධ්‍යක්ෂට ගෙවන ලද රුපියල් 5,930 ක අත්තිකාරම් මුදලක් ද මෙහි ඇතුලත් වේ. නිම කරන ලද වැඩ ප්‍රමාණයේ වටිනාකම පරීක්ෂාවට නොලැබුනි.

**9. පුස්තකාල පොත්—රු. 4,04,194 :**

(අ) විශ්වවිද්‍යාලයීය පුස්තකාලය ආරම්භයේ සිට එයට පොත් පත් හා ප්‍රකාශන මිල දී ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් කළ වියදම මින් පෙන්නුම් කෙරේ. කිසිම මුදල් වර්ෂයක අවසානයේ දී පොත් පත් හා ප්‍රකාශනවල විද්‍යාමාන හරි වැරදි බැලීමක් කර නොතිබුනි.

(ආ) විදේශීය තානාපති කායඹාල වලින් හා ආසියා පදනම වැනි ආයතන වලින් ත්‍යාගී වශයෙන් ලැබුන පොත්වල වටිනාකම ශේෂ පත්‍රයේ දක්වා නොතිබුනි. මෙම අඩුපාඩුව විශ්ව විද්‍යාලයේ ලේකම් වෙත පෙන්වා දුන් විට, ත්‍යාගි වශයෙන් මෙතෙක් ලැබුන පොත්පත්වල ලැයිස්තුවක් පිළියෙල කර ගෙන යන බවත් ඒවායේ වටිනාකම විශ්ව විද්‍යාලයේ ගිණුම් පොත්පත් වල ඇතුලත් කරන බවත් ඔහු මට දැන්විය.

(ඇ) පොත් පත් සැපයීම සඳහා විදේශීය සමාගමකට ගෙවන ලද රුපියල් 53,153 ක මුදලක් ද මෙම මුදලෙහි ඇතුලත් වේ. මෙම මිලදී ගැනීම සඳහා වූ ඉන්වොයිස් පත්‍ර ගණන් පරීක්ෂණය සඳහා නොලැබුනෙන්, මුදල් ගෙවන ලද සියලුම පොත් පත් ප්‍රවේශ ගත කළේ ද යනු සොයා ගැනීමේ ක්‍රමයක් නොතිබුනි.

**10. ගොඩනැගිලි (නොනිමි) රු. 60,14,846 :**

(අ) මෙම විෂය යටතේ ඇතුලත් විශ්ව විද්‍යාලයේ පොත්පත් වල " ගොඩනැගිලි අවිනිශ්චිත ගිණුම " යනුවෙන් පෙන්නුම් කර ඇති කලින් වර්ෂයෙන් ඉදිරියට ගෙනෙන ලද රුපියල් 5,87,841 ක මුදලක් ඒ ඒ ගොඩනැගිලිවල වියදම්වලට බෙදා දක්වා නොතිබූ බව 1963–64 වර්ෂයේ විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ මාගේ වාර්තාවේ 8 (අ) ඡේදයේ සඳහන් කළෙමි. අවිනිශ්චිත ගිණුම මකා හැරීමට කටයුතු කර ගෙන යන බව 1968 ජූලි මාසයේ දී ලේකම් මට දැන්විය. මෙය 1968 නොවැම්බර් 30 වන දින දක්වා කර නොතිබුනි.

(ආ) විශ්වවිද්‍යාල භූමිය සකස් කිරීම සහ පැති බැම්මක් බැඳීම සඳහා වියදම් වූ රුපියල් 20,000 ක මුදලක් ඉහත සඳහන් රු. 60,14,846 ක මුදලෙහි ඇතුළත් වේ. මෙම වැඩය සඳහා ටෙන්ඩර් කායඹ පටිපාටිය අනුගමනය කර නොතිබුනි.

**ජංගම වත්කම්**

**11. ද්‍රව තොග ගිණුම—රු. 30,346 :**

1965 සැප්තැම්බර් 30 වන දිනට ලැජර ශේෂය මින් පෙන්නුම් කෙරේ.

එදිනට තිබූ ද්‍රව තොගය සමීක්ෂණ මණ්ඩලයක් මගින් හරි වැරදි බලා නොතිබුනි.

**12. ප්‍රකාශන තොග ගිණුම—රු. 35,633 :**

1965 සැප්තැම්බර් 30 දිනට තිබූ නිර්දේශ පත්‍ර, පසු ගිය ප්‍රශ්න පත්‍ර පොත් ආදි විකිණිය හැකි ප්‍රකාශන තොගය මින් පෙන්නුම් කෙරේ. ප්‍රකාශන ලේඛනය අනුව එදිනට තිබූ ප්‍රකාශනවල වටිනාකම රුපියල් 34,592 කි. මෙම වෙනස විනාශ වී ගිය ප්‍රකාශනවල වටිනාකම ලෙස ලේකම් දන්වා සිටී නමුදු, මෙම විනාශ වී ගිය ප්‍රකාශනවල විස්තර ගණන් පරීක්ෂණය සඳහා නොලැබුනි.

මෙම ප්‍රකාශන තොගය වර්ෂය අවසානයේ දී සමීක්ෂණ මණ්ඩලයක් මගින් හරි වැරදි බලා නොතිබුනි. එහෙයින්, රුපියල් 35,633 ක මුදලින් පෙන්නුම් කැරුණේ 1965 සැප්තැම්බර් 30 වන දිනට තිබූ ප්‍රකාශනවල නිවැරදි වටිනාකම බව ගණන් පරීක්ෂණයේ දී සෑහීමට පත්විය නොහැකි විය.

**13. බැරකම් :**

| | | රු. |
|---|---|---|
| පුස්තකාල තැන්පත් මුදල් | ... | 23,660 |
| ටැන්ඩර් තැන්පත් මුදල් | ... | 8,944 |
| විද්‍යා තැන්පත් මුදල් | ... | 1,170 |
| වෙනත් තැන්පත් මුදල් | ... | 5,743 |
| **ශිෂ්‍ය සමිති දායක මුදල්** | ... | **8,621** |

මෙම තැන්පත් මුදල් වෙනුවෙන් සවිස්තර උප ලේඛන ඉදිරිපත් නොකෙරුණි.

**ආදායම් සහ වියදම් ගිණුම**

**14. ආදායම—රු. 1,77,737 :**

සමාලෝචනයට භාජනය වන වර්ෂය වෙනුවෙන් විශ්ව විද්‍යාලය විසින් ඇස්තමේන්තු කළ ආදායම රුපියල් 1,29,000 ක් වූ අතර යට සඳහන් පරිදි ඇත්ත වශයෙන් ම ලැබී ඇති ආදායම රුපියල් 1,77,737 ක් විය.

| | | ඇස්තමේන්තු කළ ආදායම රුපියල් | | ලැබී ඇති ආදායම රුපියල් |
|---|---|---|---|---|
| (i) ලේඛ්‍යාරූඪවීමේ ගාස්තු | ... | 50,000 | ... | 66,842 |
| (ii) විභාග ගාස්තු | ... | 60,000 | ... | 82,323 |
| (iii) මිශ්‍ර ආදායම | ... | 3,000 | ... | 10,912 |
| (iv) ප්‍රකාශන විකිණීම | ... | 7,000 | ... | 5,435 |
| (v) නිවාස කුලී | ... | 9,000 | ... | 9,628 |
| (vi) පොලී මුදල් | ... | — | ... | 2,597 |
| එකතුව | ... | 1,29,000 | | 1,77,737 |

ඉහත සඳහන් (i), (ii) සහ (v) විෂයයන් යටතේ ලැබිය යුතු මුළු ආදායම ගිණුම් ගත කළ බව ගණන් පරීක්ෂණයේ දී සෑහීමට පත්වීම සඳහා සෑහෙන වාර්තා නොතිබුනි.

**15. වියදම :**

වැය ශීර්ෂ දෙලහක් යටතේ ප්‍රතිපාදනයන් රුපියල් 1,61,141 කින් ඉක්මවා තිබූ අතර, නව වැය ශීර්ෂයක් යටතේ වියදම රුපියල් 1,600 ක් විය. මෙම වියදම්වල විස්තර පහත දැක්වේ :—

| | වියදම | ඇස්තමේන්තුව | අතිරික්තය |
|---|---|---|---|
| ගමන් වියදම් | ... 8,294 | ... 5,000 | ... 3,294 |
| වාහන නඩත්තු | ... 11,530 | ... 5,000 | ... 6,530 |
| ලිපි ද්‍රව්‍ය හා මුද්‍රණ වියදම් | ... 29,853 | ... 27,000 | ... 2,853 |
| දුරකථන හා තැපැල් වියදම් | ... 16,146 | ... 12,000 | ... 4,146 |
| දැන්වීම් ගාස්තු | ... 12,409 | ... 9,000 | ... 3,409 |
| විභාග ගාස්තු | ... 2,23,792 | ... 1,00,000 | ... 1,23,792 |
| අනියම් වියදම් | ... 6,085 | ... 3,000 | ... 3,085 |
| නීතිවේදී වැය | ... 5,448 | ... 1,000 | ... 4,448 |
| ඇඳුම් පැළඳුම් දීමනා | ... 1,800 | ... 1,300 | ... 500 |
| පුවත්පත් හා සඟරා | ... 1,263 | ... 1,000 | ... 263 |
| අතිකාල දීමනා | ... 1,939 | ... 1,000 | ... 939 |
| ගබඩා වියදම් | ... 10,882 | ... 3,000 | ... 7,882 |
| | 3,29,441 | 1,68,300 | 1,61,141 |

**නව වැය ශීර්ෂ**

**ශිෂ්‍ය සමිති ආධාර ... 1,600**

වෙනත් වියදම් ශීර්ෂවල ඉතිරිවීම් වලින් මෙම රුපියල් 1,62,741 ක් වූ වියදම් අතිරික්තය පියවා ඇත.

**16. වැටුප් සහ දීමනා—රු. 12,24,793 :**

(අ) විශ්ව විද්‍යාලයෙන් විශ්‍රාම ලැබූ භික්ෂූන් වහන්සේලාට විශ්ව විද්‍යාල පනතේ අංක 60 වගන්තිය අනුව විශ්‍රාම දීමනා වශයෙන් ගෙවනු ලැබූ රුපියල් 4,493 ක මුදලක් ද ඉහත සඳහන් රුපියල් 12,24,793 ක මුදලෙහි ඇතුලත් වේ.

(ආ) විශ්වවිද්‍යාලය විසින් සේවයේ යොදවනු ලැබූ රජයේ විශ්‍රාමිකයන් හතර දෙනෙකුට, 1962 මැයි 15 වන දින අංක 543ඊ/164 ඩී දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛනයෙන් දනුම් දෙන ලද කැබිනට් මණ්ඩලය විසින් නියම කරනු ලැබූ සීමාවත් ඉක්මවා වර්ෂය තුලදී ගෙවනු ලැබූ රුපියල් 14,900 ක (දළ වශයෙන්) මුදලක් ද රුපියල් 12,24,793 ක මුදලෙහි ඇතුලත් වේ. මෙම වැඩිපුර ගෙවීම් ගැන විශ්වවිද්‍යාල බලධාරීන්ටත්, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයටත්, ජාතික උසස් අධ්‍යාපන සභාවටත් දැන්වූයෙමි. විශ්ව විද්‍යාලය විසින්, ආචාර්‍ය්‍යවරුන් සම්බන්ධයෙන් මෙම කැබිනට් මණ්ඩල තීරණයේ අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කරන ලෙස ඉල්විය යුතු යයි ද, ආචාර්‍ය්‍යවරුන් නොවන සේවකයින් විසින් මෙම කැබිනට් තීරණයේ අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කරණ ලෙස පුද්ගලිකව ඉල්වා සිටිය යුතු යයි ද 1968 මාර්තු මස 31 වන දින පැවති සිය රැස්වීමේ දී ජාතික උසස් අධ්‍යාපන සභාව තීරණය කළාය.

**17. අර්ථසාධක අරමුදලට දායක මුදල්—රු. 86,325 :**

විශ්ව විද්‍යාල පනතේ 38 (3) වගන්තිය අනුව, අර්ථසාධක අරමුදලේ දායකයින්ට හිමි පොලිය ගෙවීම සඳහා වෙන් කරන ලද රුපියල් 5,000 ක මුදලක් ද මෙම මුදලෙහි ඇතුළත් වේ.

1963–64 වර්ෂයේ අර්ථසාධක අරමුදල දායක මුදල් යටතේ ඇතුලත් එම වර්ෂයේ පොලී මුදල් ගෙවීම සඳහා වෙන් කැරුණ රුපියල් 5,500 ක මුදලක් විශ්වවිද්‍යාල අරමුදලට කැරුණ නිවැරදි හරකිරීමක් නොවන බව 1963–64 වර්ෂයේ විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ මාගේ වාර්තාවේ 13 වන ඡේදයේ සඳහන් කළෙමි.

අර්ථසාධක අරමුදලේ දායකයින්ට හිමි පොලිය ගෙවීම සඳහා විශ්වවිද්‍යාල අරමුදල් යෙදීමට පනතේ 38 (3) වගන්තියෙන් ප්‍රතිපාදනයන් සලසා නැතත් මේ සඳහා අර්ථසාධක අරමුදලින් ලැබූ ආදයම ප්‍රමාණවත් නොවුන නිසා මෙම වියදම විශ්ව විද්‍යාල අරමුදලින් දැරීමට සිදුවූ බව 1968 ජූනි මාසයේ දී ලේකම් මට දැන්විය.

**18. වාහන නඩත්තු වියදම්—රු. 11,530 :**

වාහනවල දෛනික ධාවන වාර්තා සහ මාසික සාරාංශ ගණන් පරීක්ෂණය සඳහා නොලැබුන බව 1963–64 වර්ෂයේ විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ මාගේ වාර්තාවේ 15 වන ඡේදයේ සඳහන් කළෙමි. 1964–65 වර්ෂය වෙනුවෙන් 1968 ජූනි 20 වන දින ලැබුන දෛනික ධාවන වාර්තාවල දිනපතා දවුන ඉන්ධන ප්‍රමාණය හා ගමන් කළ සැතපුම් ප්‍රමාණය සඳහන් නොවුනි. කරුණු මෙසේ හෙයින්, රුපියල් 11,530 ක වියදම රථවාහන නඩත්තු වෙනුවෙන් කරන ලද නිවැරදි වියදමක් බවට ගණන් පරීක්ෂණයේ දී සෑහීමට පත්විය නොහැකි විය.

**19. විදුලිය හා ජලය—රු. 10,118 :**

විශ්ව විද්‍යාලයේ ගොඩනැගිලිවල පිහිටුවා ඇති ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පාවිච්චි කළ විදුලිය හා ජලය වෙනුවෙන් අයකර ගත් රුපියල් 3,000 ක මුදලක් හිලව් කිරීමෙන් පසු විදුලිය හා ජලය වෙනුවෙන් විශ්ව විද්‍යාලය විසින් කළ ඉතිරි වියදම මින් පෙන්නුම් කෙරේ. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට සැපයුන විදුලිය හා ජලය වෙනුවෙන් වෙනම මීටර සවිකොට නොතිබුනෙන්, මෙම සේවාවන් සඳහා එම දෙපාර්තමේන්තුවෙන් මාසිකව රුපියල් 250 ක මුදලක් අයකර ගෙන තිබුනි.

**20. විභාග ගාස්තු—රු. 82,323**

**විභාග වියදම්—රු. 2,23,792**

ප්‍රශ්න පත්‍ර තැනීම සහ ප්‍රමිත කිරීම සඳහා පරීක්ෂකවරුන්ට ගෙවන ලද ගාස්තු, ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීමේ හා ඒ හා සම්බන්ධ අනිකුත් වියදම් ද විභාග පැවැත්වීමේ වියදම් හා උත්තර පත්‍ර බැලීම සහ සමීක්ෂණය කිරීම සඳහා පරීක්ෂකවරුන්ට ගෙවන ලද මුදල් ද මින් පෙන්නුම් කෙරේ.

විශ්ව විද්‍යාල පනතේ 18 (එල්) වගන්තිය යටතේ පාලක සභාව විසින් විභාග පරීක්ෂකවරුන් පත් කරනු ලැබ නොතිබුනි.

විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පරීක්ෂණයන් හා සම්බන්ධ සේවාවන් වෙනුවෙන් විශ්ව විද්‍යාලයේ ආචාර්‍ය්‍ය මණ්ඩලයට ගෙවනු ලැබූ ගාස්තු ද විභාග වියදම්වලට ඇතුලත් වේ. තමන් විසින් උගැන්වූ විෂයයන් පිළිබඳව සිය ශිෂ්‍යයින් පරීක්ෂා කිරීම සඳහා විශ්ව විද්‍යාලවල ආචාර්‍ය්‍ය මණ්ඩලයට ගාස්තු ගෙවීමේ යෝග්‍යතාවය ගැන දැනට ජාතික උසස් අධ්‍යාපන සභාව විසින් සමාලෝචනය කර ගෙන යනු ලැබේ.

**21. ශිෂ්‍ය නිවාසයේ පාඩුව—රු. 21,299 :**

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල දී ශිෂ්‍ය නිවාසය පවත්වා ගෙන යාමෙන් ලත් පාඩුව රුපියල් 21,299 ක් වූ අතර ඊට පෙර වර්ෂයේ පාඩුව රුපියල් 6,736 ක් විය. පාඩුව විශ්වවිද්‍යාල අරමුදලින් දැරීමට පාලක සභා අනුමැතියක් නොතිබුනි.

විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍ය නිවාසය පවත්වා ගෙන යෑම 1967 ජූලි මාසයේදී අත්හැර දමා කොන්ත්‍රාත්කරුවෙකුට භාර දෙන ලදී.

**ශිෂ්‍ය නිවාසයේ ආදයම් සහ වියදම් ගිණුම**

ආදයම :

**22. ශිෂ්‍ය නිවාස ගාස්තු—රු. 35,703 :**

ශිෂ්‍ය නිවාස ගාස්තු ලේඛනයක් තබාගෙන නොතිබුනි. එම ලේඛනයක් නොමැතිවූයෙන් වර්ෂය සඳහා ගිණුම් ගත කළ ශිෂ්‍ය නිවාස ගාස්තු ගණන් පරීක්ෂණයේදී හරි වැරදි බැලිය නොහැකි විය.

1967 අප්‍රේල් 16 වන දින සිට ශිෂ්‍ය නිවාස ගාස්තු ලේඛනයක් තබා ගෙන ඇති බව 1968 ජූනි මාසයේ දී ලේකම් මට දැන්විය.

**23. පොදු කරුණු :**

**(i) නිලධාරීන් විසින් තැබිය යුතු ඇප :**

විශ්ව විද්‍යාලයෙහි නිල බැංකු ගිණුමෙහි චෙක්පත් අත්සන් කිරීමට පවරා ඇති ලේකම්, නියෝජ්‍ය ලේකම්වරු, සහකාර ලේකම්වරු සහ ගණකාධිකාරී ද ඇප තබා නොතිබුනි. මෙම කාරණය 1968 ජූනි මාසයේ දී ලේකම් වෙත දන්වා සිටියෙමි.

**(ii) කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබා ගතයුතු ඇප මුදල් :**

කොන්ත්‍රාත්කරුවන්ට පවරා ඇති වැඩ සතුටුදයක අන්දමින් නිමකරනු ලැබීම සහතික කරනු සඳහා ඔවුන්ගෙන් ඇප ලබා ගෙන නොතිබුනි. මෙම කරුණු ලේකම්ට පෙන්වා දුන් විට මතු කොන්ත්‍රාත් වැඩ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඇප ලබා ගන්නා බව ඔහු මට දැන්විය.

ඒ. ගුණනායගම්,
ඔඩිටර් ජනරාල් වෙනුවට.

**30.9.1965න් අවසන් වූ වර්ෂය පිළිබඳ ඔඩිටර් ජනරාල් තුමාගේ වාර්තාව පිළිබඳ මහාධිකාරී මණ්ඩලයේ විශේෂ කමිටුවේ වාර්තාව**

ඔඩිටර් ජනරාල්තුමාගේ වාර්තාව 30.9.65න් අවසන්වූ වර්ෂය පිළිබඳවය. ඉන්පසු වර්ෂ හතරක් (4) ගතවී ඇති බැවින්, ඉහතකී වාර්තාවෙහි සඳහන් කරන ලද අඩු ලුහුඩුකම්, ඊට පසු වර්ෂවලදීත් එලෙසින්ම ඇතිවන්නට ඉඩ ඇතිවාක් මෙන්ම, එම වර්ෂවලට අදල වාර්තාවන්හිදී නැවත නැවතත් සඳහන් වීමටද ඉඩ ඇත. සෑම වර්ෂයකම ගණන් හිලවු, ඊටපසු වර්ෂයේදීම, පරීක්ෂණයට භාජනකොට වාර්තා කරවා ගැනීමට ගිණුම් අංශය උනන්දු විය යුතුය. වාර්තා වෙහි පෙන්වන අඩු ලුහුඩුකම්, එම වර්ෂයේදීම මග හරවා ගැනීමටද, එකම විවේචනය නැවත නැවතත් පසු වාර්තාවල සඳහන් වීම මගහරවා ගැනීමටද මින් ඉඩකඩ සැලසේ. පරීක්ෂණය මෙවැනි විධිමත් අන්දමට කරගන යෑමට ඔඩිටර් ජනරාල් තුමාට යම්යම් ප්‍රායෝගික අපහසුකම් ඇත්තේනම් එතුමාගේ අවසරය හා නියෝගය පරිදී පෞද්ගලික ගණන් පරීක්ෂක සමාගමක් ලවා ගණන් පරීක්ෂණය සෑම වසරක් පාසාම කරගන යෑමේ සුදුසුකම මහාධිකාරී මණ්ඩලය විසින් බැලිය යුතුව ඇත.

**2 ඡේදය :**

මෙම ඡේදයෙහි ආදයම සහ වියදම පිළිබඳ පමණක් සඳහන්ව ඇත. ඒ පිළිබඳ අදහස් දැක්වීමක් අවශ්‍ය නොවේ.

**3 සහ 4 ඡේදයන් :**

යම් යම් දෑ පිළිබඳ ලැයිස්තු පවත්වා ගෙන ගොස් නොමැත. එවැනි ලැයිස්තු පිළියෙල කරගන යන බව ලේකම් විසින් දන්වන ලදී. ලැයිස්තු සකස් කිරීමෙහිලා අදලවන අවශ්‍ය කරුණු විවිධ අංශවලින් ලබාගත යුතු

හෙයින් එය තරමක් ප්‍රමාද වන බව ඔහුගේ මතයයි. 28.2.70 දිනට ප්‍රථම ලැයිස්තු පිළියෙල කිරීම කළයුතු බවට උපදෙස් දුනිමු. විශ්ව විද්‍යාලයට පවරා ගන්නා ලද ඉඩ කඩම් සම්බන්ධව පැවරුම් නියෝග නොමැත. දිසාපති තුමාට ඒ පිළිබඳ ලියූ ලිපිවලට පිළිතුරු ලබාගැනීම අපහසු කාර්‍යයක් වී ඇති බැවින් කච්චේරියට ගොස් පැවරුම් නියෝග නොසමාව ලබා ගන්නා ලෙස කාර්‍යාල සහායක තුමාට උපදෙස් දී ඇත. 28.2.70 දිනට පෙර මෙය ලබාගැනීමට ලේකම් අදහස් කරයි.

**5 ඡේදය :**

ක්‍රීඩා භූමිය මට්ටම් කිරීමෙහිලා වියදම් වූ රුපියල් 5,756 ක මුදලක්, ක්‍රීඩා භූමියෙහි වටිනාකම ලෙස පෙන්වා ඇති අතර, එම ඉඩම මිලයට ගැනීමේ වටිනාකම අඩංගු වී ඇත්තේ විශ්ව විද්‍යාලය විසින් මිලයට ගන්නා ලද සියලුම "ඉඩම්" ශීර්ෂය යටතේ ය. පසු වර්ෂවලදී, ක්‍රීඩා භූමිය මට්ටම් කිරීමට වියදම් වූ මුදල ඉඩම්වල වටිනාකමට එකතු කොට ඇත. මට්ටම් කිරීමෙන් ඉඩමෙහි වටිනාකම වැඩි වන බැවින් මෙම ක්‍රියාව යුක්ති යුක්තය.

**6 ඡේදය :**

ගෘහ නිර්මාන ශිල්පීන්ගේ ගාස්තු "ගොඩනැගිලි ගිණුම"ට මාරු කළ යුතුය. මෙම අවශ්‍යතාවය දැන් ඉටුවී ඇති බව ලේකම් වාර්තා කරයි.

**7 ඡේදය :**

විද්‍යා අංශයේ පාරිභෝගික බඩු, ස්ථිර ගණයේ ගැනෙන විද්‍යා උපකරණ වල අගයට එකතු කොට ඇත. මෙම පාරිභෝගික බඩුවල අගය නිශ්චය-කොට විද්‍යා උපකරණ ගිණුම 1968/69 ගිණුම් වර්ෂයේදී නිසි ලෙස සංශෝධනය කිරීමට හා 28.2.70 දිනට පෙර මහාධිකාරී මණ්ඩලයට ඒ ගැන වාර්තා කිරීමට ලේකම් බාර ගන්නා ලදී.

**8 ඡේදය :**

රුපියල් 5,930 ක මුදලක් ජලා ප්‍රවාහන හා සම්පාදක අධ්‍යක්ෂක තුමාට 1965 අගෝස්තු මාසයේ දී අත්තිකාරම් කර ඇත. නිශ්චිත වශයෙන් නිම කර ඇති වැඩ කොටසෙහි අගය ස්ථිර වශයෙන් දැනගැනීමට නැත. එහි නියම වටිනාකම රුපියල් 5,930 බව ලේකම් විසින් පසුව දැනගන්නා ලදී.

**9 ඡේදය :**

(ඒ) පුස්තකාලයෙහි ඇති පොත් පත් සහරා ආදිය පිළිබඳ විද්‍යමාන හරි වැරදි බැලීමක් කොට නොමැත. 1968/69 වර්ෂයෙහි පුස්තකාලයෙහි විද්‍යමාන බඩු ගණන් ගැනීමක් කර ඇති බව පුස්තකාලයාධිපති තුමා කියා සිටී. 28.2.70 දිනට පෙර එහි වාර්තාව ඉදිරිපත් කිරීමට ඔහු බාර ගන්නා ලදී.

(බී) විවිධ ආයතනයන්ගෙන් ත්‍යාගයන් ලෙස ලද පොත් පත් වල වටිනාකම ශේෂ පත්‍රයෙහි පෙන්වා නොමැත. එහි වටිනාකම සොයා බලා නිශ්චය කොට 28.2.70 දිනට ප්‍රථම මහාධිකාරී මණ්ඩලයට වාර්තා කිරීමට පුස්තකාලයාධිපති පොරොන්දු වන ලදී.

(සී) පොත් පත් මිලයට ගැනීම සඳහා වෙළඳ ආයතනයකට ගෙවන ලද රුපියල් 53,153 මුදලක් පොත් පත්වල වටිනාකමෙහි අඩංගු වී ඇත. මෙම මිලයට ගැනීමට අදාල වන ලිපි ලේඛන ගණන් පරීක්ෂණය සඳහා ඉදිරිපත් නොකරණ ලදී. අදාල ලිපි ලේඛන ගෙන්වා ගෙන ඒ පිළිබඳව 28.2.70 දිනට පෙර වාර්තා කිරීමට පුස්තකාලයාධිපති විසින් පොරොන්දු වන ලදී.

**10 ඡේදය :**

(ඒ) "ගොඩනැගිලි අවි නිශ්චිත ගිණුම" අයින් කර නොමැත. 1968/69 වර්ෂයෙහිදී ගිණුම් වලදී මෙම ගිණුම අවසන් කිරීමට ලේකම් විසින් පොරොන්දුවන ලදී.

(බී) විශ්ව විද්‍යාල භූමිය සකස් කිරීමෙහි හා ආධාරක තාප්පයක් බැඳීමෙහි කටයුතු වලදී ටෙන්ඩර් පිළිවෙත අනුගමනය කර නැත. මෙම කටයුත්ත කලින් කාල පරිච්ඡේදයකට අදල වන බැවින් දැන් එය නිවැරදි කිරීම අසීරු කරුණකි. මහාධිකාරී මණ්ඩලයේ විශේෂ නියෝගයකදී හැර අනික් සෑම කොන්ත්‍රාත්තුවක්ම දැන් ටෙන්ඩර් පිළිවෙත අනුගමනය කරන බව අපට පෙනී යයි.

**11 ඡේදය :**

දැව පිළිබඳ විද්‍යමාන ගණන් ගැනීමක් කොට නොමැත. සඳහන් වූ දැව රුපියල් 16,075 කට විකුණා ඇති බවත්, එම මුදල ප්‍රාග්ධන ගිණුමට බැර කරණ ලද බවත්, ලේකම් පවසයි.

**12 ඡේදය :**

"විනාශ වූ ප්‍රකාශන" පිළිබඳ තොරතුරු ලබාගැනීමට අපහසු වී ඇත. "ප්‍රකාශන වියදම් තොග ගිණුම" දැන් අවසන් කර ඇති බවත්, එහි වටිනාකම ගණන් පරීක්ෂණයන්ගේ ද අනුදැනීම ඇතිව ආදයම් සහ වියදම් ගිණුමින් කපා හැර ඇති බවත් ලේකම් විසින් දන්වන ලදී.

**13 ඡේදය :**

"තැන්පතු" සම්බන්ධව විස්තරාත්මක උපලේඛන තබා නොමැත. 1.10.64 දිනට පසු කරණ ලද තැන්පතු සම්බන්ධව විස්තරාත්මක උපලේඛන දැන් සකස් කොට ඇති බව ලේකම් පවසයි. අදල කරුණු සොයා ගැනීමට ඇති අපහසු කම නිසා මීට කලින් තැන්පතු උපලේඛනවල අඩංගු කිරීම අසීරු කරුණක් වී ඇත. එමනිසා 1.10.64 දිනට ප්‍රථම තැන්පතු සංචිත ගිණුමකට බැර කරන ලදී.

**14 ඡේදය :**

ලේඛ්‍යාරූඪ කිරීමේ ගාස්තු, විභාග ගාස්තු, ගෙවල් කුලී ආදියෙන් ලැබිය යුතු මුළු ආදයම කවරේදැයි ගණන් පරීක්ෂණයේදී දැනගැනීම සඳහා අවශ්‍ය ලිපි ලේඛනාදිය තබා නොතිබුනි. ලියාපදිංචි කිරීමේ ගාස්තු, විභාග ගාස්තු, ගාස්තුවලින් නිදහස් කිරීම, ගාස්තු මාරු කිරීම ආදිය පිළිබඳව ලිපි ලේඛන සකස් කොට පවත්වාගෙන යෑමට හා නිලධාරියෙකු ලවා, ලැබිය යුතු මුදලත් ලැබුණ මුදලත් එකඟ කිරීමට කටයුතු යොදන ලෙසට නියෝජ්‍ය ලේකම් (විභාග) ට උපදෙස් දෙන ලදී. ඒ පිළිබඳව යොදන ලද පිළිවෙත ගැන 31.3.70 දිනට ප්‍රථම මහාධිකාරී මණ්ඩලයට දන්විය යුතුය. 1968/69 වර්ෂය සඳහා ගෙවල් කුලී පිළිබඳ ලේඛනයක් සකස් කොට, පවත්වාගෙන යෑමට හා නිසි ලෙස එකඟ කිරීමට, කටයුතු යෙදීමට ලේකම් තුමා විසින් භාරගන්නා ලදී.

**15 ඡේදය :**

මේ පිළිබඳ අදහස් දැක්වීමක් අවශ්‍ය නැත.

**16 ඡේදය :**

(ඒ) මේ පිළිබඳ අදහස් දැක්වීමක් අවශ්‍ය නැත.

(බී) අමාත්‍ය මණ්ඩලයේ තීරණය ඉක්මවා, රජයේ විශ්‍රාම වැටුප් ලබන්නන් ට කරන ලද ගෙවීම්.

විශ්ව විද්‍යාල, මෙම තීරණයෙන් නිදහස් කරවා ගැනීමට කටයුතු යොදන මෙන් ජාතික උසස් අධ්‍යාපන සභාව උපදෙස් දී ඇත. එවැනි නිදහස් කිරීමක් කරන ලෙස ලේකම් විසින් ඉල්ලීමක් කරන ලදී.

**17 ඡේදය :**

අර්ථසාධක අරමුදලට කරන වෙන් කිරීම් සඳහා පොළී ගෙවීමට විශ්ව විද්‍යාල අරමුදල් යොද ගෙන ඇත. අර්ථසාධක අරමුදලින් ලැබෙන ආදයම ප්‍රමාණවත් නොවූ බැවින් එසේ කරන ලදී. මෙම ආදයම දැන් ඉහල ගොස් ඇති බැවින්, විශ්ව විද්‍යාල විසින් දරන ලද වියදම කපා ගැනීමට යථා කාලයේදී හැකිවෙනවා ඇත. අර්ථසාධක අරමුදල භාරකාර මණ්ඩලයක් මගින් පාලනය විය යුතු බව අපගේ අදහසයි. අරමුදල කුමන වර්ගයේ ආයෝජන සඳහා යෙදිය යුතුද එයින් දෙනු ලබන ණය මුදල් සඳහා කෙතරම් පොලී ප්‍රමාණයක් අයකළ යුතුද යන කරුණු ගැන මහාධිකාරී මණ්ඩලයෙන් අනුමත වූ තීරණයන් ගැනීමට භාරකාර මණ්ඩලයට බලය තිබිය යුතුය. මෙවැනි ක්‍රියා මාර්ගයක සම්පූර්ණ විස්තරයක් ලේකම් විසින් මහාධිකාරී මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුවේ.

**18 ඡේදය :**

"දිනපතා වාහන දිවීමේ ලේඛන" වලින් දිනපතා අවශ්‍ය වන පෙට්රල් ප්‍රමාණයද, දිනපතා දුවන සැතපුම් ගණනද දැනගැනීමට නොහැකිවී ඇත. ඒ පිළිබඳව අවශ්‍ය ප්‍රතිකර්ම දැන් යොදා ඇති බව ලේකම් පවසයි.

**19 ඡේදය :**

රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට සපයන විදුලි බලය හා ජල ප්‍රමාණය දැන ගැනීම සඳහා වෙනම මාපක යන්ත්‍ර යොද නැත. මෙම දෙපාර්තමේන්තුව ලඟදීම මෙතැනින් අන් තැනකට ගෙන යන බැවින්, ඒ පිළිබඳව දැන් වෙනම මාපක යන්ත්‍ර යෙදීමට අතිරේක වියදමක් දැරීම අනවශ්‍ය වේ. ඒ පිළිබඳව නාමමාත්‍ර අයකිරීමක් කිරීමේ වර්තමාන පිළිවෙත මහාධිකාරී මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

**20 ඡේදය :**

(1) විභාග පරීක්ෂකයන් පත් කිරීම "මණ්ඩලයෙන්" නො කෙරේ. එම කටයුත්ත දැන් කරනු ලබන්නේ මහාධිකාරී මණ්ඩලය මගිනි.

(2) ඉගැන්වීමෙහි කාර්‍යයෙහි යෙදෙන ආචාර්ය මණ්ඩලයට ගාස්තු ගෙවීමේ යෝග්‍යතාව පිළිබඳ උසස් අධ්‍යාපන සභාවේ තීරණය දැන් ලැබී ඇත. උසස් අධ්‍යාපන සභාව මගින් යම් යම් ප්‍රමාණයන් නියම කොට ඇති බව ඉන් පැහැදිලි වේ.

**21 ඡේදය :**

ශිෂ්‍ය නිවාසය පවත්වා ගෙන යෑමෙන් ඇතිවූ පාඩුව, විශ්ව විද්‍යාල අරමුදලින් පියවා ඇත. දැන් ශිෂ්‍යයන් විසින්ම ශිෂ්‍ය නිවාසය පවත්වා ගෙන යන බැවින් මෙම ප්‍රශ්ණය මින් ඉදිරියට ඇතිවන්නේ නැත.

**22 ඡේදය :**

වැරදි හරිගස්වා ඇති බැවින් මේ පිළිබඳ අදහස් දැක්වීමක් අවශ්‍ය නැත.

**23 ඡේදය :**

(1) වැක්පත් අත්සන් තැබීමට බලය ලත් නිලධාරීන්ගෙන් ඇපයක් ලබාගෙන නොමැත. මෙම කාරණය මහාධිකාරී මණ්ඩලයට ඉදිරිපත් කළ බවත්, එම නිලධාරීන්ගෙන් ඊට සුදුසු ඇපයක් ලබාගැනීමට කටයුතු කිරීමට මහාධිකාරී මණ්ඩලය තීරණය කොට ඇති බවත් ලේකම් විසින් දන්වන ලදී.

(2) කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඇපයක් ලබාගෙන නොමැත. මින් ඉදිරියට කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඇප මුදල් තැන්පත් කිරීමක් ලබා ගන්නා බවත් ලේකම් විසින් දන්වන ලදී.

ඩී. ඇල්. එෆ්. පේද්‍රිස්, එස්. බී. යටවර, ඩබ්ලිව්. එම්. තිලකරත්න.
(මහාධිකාරී මණ්ඩලයේ විශේෂ කමිටුවේ සාමාජිකවරු.)

1970.2.18 දින පැවැති මහාධිකාරී මණ්ඩලයේ 58 වැනි රැස්වීමේ වාර්තාවේ 1092 ඡේදයෙන් පිළිගන්නා ලදී.

1970.2.2,
විද්‍යොදය විශ්ව විද්‍යාලය,
නුගේගොඩ.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1959 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරණ ණය සහනදයක ආඥපනත

1959 අංක 5 දරණ (සංශෝධිත) පනතින් සංශෝධිත 1941 අංක 39 දරණ ණය සහනදයක ආඥපනත යටතේ පහත දක්වෙන උපලේඛනයේ අංක 1 සහ 2 යන ශීර්ෂයන්හි දක්වෙන ණයකරුවන් හා ණයහිමියන් යන දෙපක්ෂය අතරේ බෙරුමක් ඇති කිරීමට ණය සහනදයක මණ්ඩලය අදහස් කර ඇත.

මේ සඳහා ඒ ඒ ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය පිළිබඳ විස්තර ප්‍රකාශයන් 1970 අප්‍රේල් මස 12 වෙනි දිනට පෙර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස ණයහිමියෙන්ට මෙයින් දන්වනු ලැබෙ.

ඇම්. ඒ. අමරසිංහ,
ණය සහනදයක මණ්ඩලයේ ලේකම්.

1970 මාර්තු මස 18 වැනි දින,
කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ,
අංක 33/1, ''අමීරා'' දරණ ස්ථානයේ පිහිටි
ණය සහනදයක මණ්ඩලයේ දිය.

### උපලේඛනය

| ඉල්ලුම්පත් අංකය | | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|---|
| 23602 | ... | ඇම්. ටී. ඇම්. මවුසූන්, 1337/1, කෙලින් වීදිය, කටුකුරුන්ද,කළුතර දකුණ | මොහොම්මඩ් සාලි ලෙබ්බෙ මොහමඩ් කසීම්, ''ගෝල් හවුස්'', කෙලින් විදිය, මග්ගොන |
| 23603 | ... | අබ්දුල් වහබ් මොහමඩ් සුහුඩ්, 236, දිප්පිටිය, අරනායක ... | පනාගොඩගේ මාග්‍රට් පෙරේරා, අරනායක වත්ත, අරනායක |
| 23604 | ... | අහමීඩ් සයිබු මොහමඩ් බෂීර්, 211, අඹගමුව පාර, ගම්පොල ... | 1. දම්පැල්ලේගම ආරච්චිගේ ගිරිගෝරිස් අප්පුහාමි, 2. දම්පැල්ලේගම ආරච්චිගේ මාටින් අප්පුහාමි, 3. දම්පැල්ලේගම ආරච්චිගේ ප්‍රේමදස, දුම්රියපල පාර, උලපනේ |
| 23605 | ... | ජයමංගලදූරයලාගේ පියදස, ගොඩිගමුව, උස්සාපිටිය ... | රාජපක්ෂපේඩිගේ ලියන්නා, දූල්දෙනිය, අරනායක. |
| 23607 | ... | පිලිප්පැන්ගේ ආයුවර්ධන සිල්වා, එදිරිසිංහවත්ත, යටියන, මීනුවන්ගොඩ | කාලිංග දෝන ධනවතී තිලකරත්න, පී. ආර්. ඇස්. ගුණවර්ධන බාරේ, 50, උන්නාරුව, මීනුවන්ගොඩ |
| 23609 | ... | 1. නුවරපක්ෂපේඩිගේ පාවුලුවා, 2. වීරසුන්දරපේඩිගේ සොයිද, යබොරොලුව, මල්වාන | එච්. කිරිබයියා, යබොරොලුව, මල්වාන |
| 23610 | ... | ඇම්. සි. නූර් මොහමඩ්, දෙහිඅංග, මුරුතලාව ... | බෙරවාගොඩගෙදර පිංචි, ගුරුගම, මුරුතලාව |
| 23613 | ... | දියුනුගල්ගේ සිරිරත්න ජයසේකර, අරන්දර, අටාලේ ... | ලියනගේ ජයරත්න, අරන්දර, අටාලේ |
| 23614 | ... | යූ. බී. කුලතුංග, අංක 1, කිරින්ද, හොන්ඩියදෙනිය, ගම්පොල ... | ජී. ජී. සමරතුංග, කිරින්ද, හොන්ඩියදෙනිය |
| 23624 | ... | ඩෙමුනි දමිස් ද සොයිසා, අංක 20, දෙල්ගහවත්ත, සිරිසුමංගල පාර, රත්මලාන | ඩී. ඒ. ඇෆ්. ජයසේකර, අංක 4, ඇල්ප්‍රඩ් පෙරේරා මාවත, නුගේගොඩ |
| 23625 | ... | විතාරනගමගේ දයානන්ද, 68, නුවර පාර, දළුගම, කැළණිය ... | නන්ද ඇපසිංහ, ''වාසල වලව්ව'', තංගල්ල |
| 23626 | ... | 1. ජෝන් ඊ. තම්බිමුත්තු, 2. සින්නතම්බි රාසම්මා, 16/1, ත්‍රිකුණාමල පාර, මඩකලපුව | මුරුගේස පිල්ලෙයි මාරිමුත්තු, කේ. වීරකුට්ටි බාරේ, නොතාරිස් තැන, මරුත්තමුනෙයි |
| 23628 | ... | කිරිගිගනගේ ඩාර්ලිස් සිංඤෝ, දියඇල, නාකුළුගමුව ... | වීරසූරිය ආරච්චිගේ ජෝන්මහත්මයා, මැකිලියහේන, ගලගම, නාකුළුගමුව |
| 23630 | ... | 1. ඇස්. ඇල්. අබ්දුල්රහීම්, 2. ඒ. ආර්. චිත්ති සුබෙයිද, ෂර්ටහවුස් මාර්කට් බාරේ, චාවකච්චේරි | මුහමදු කාදර් අබ්දුල් කාදර්, ඇම්. ඇම්. ඉස්මායිල් සහ පුත්‍රයෝ, වෙලෙන්දෝ බාරේ, චාවාකච්චේරි. |
| 23631 | ... | පැලැන්දඅප්පුහාමිල්ලාගේ ඇසිලින් නෝනා, ඉහල ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ | ජී. හෙන්ද්‍රික් අප්පුහාමි, 14 සැතපුම් කණුව, ඉහළ ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ |
| 23632 | ... | මොහමඩ් අබ්දුල් රහුමාන් බින්දි පායිකා, කුරුඳුවත්ත, ගිංතොට, ගාල්ල | ආගම්පොඩි එමාලියස් ද සිල්වා, ඕවකන්ද, රත්ගම, දෙඩන්දූව |
| 23633 | ... | සරස්වතී ජෝන්, වන්නන්කෝඩ්ඩම්, ඉනුවිල් පාර, මනිපායි ... | වෙල්ලන් නාගාර්, කොකුවිල් බටහිර, කොකුවිල් |
| 23634 | ... | දලුවතුමුල්ලේගමගේ ඇලිස්නෝනා, පැරැලිය, තෙල්වත්ත ... | අයියප්පුගේ ප්‍රේමරත්න, පැරැලිය, තෙල්වත්ත |
| 23635 | ... | නෝරා ගර්රූඩ් මැන්ඩිස් වික්‍රමසිංහ, මහවස්කඩුව, වස්කඩුව ... | කරුණාමුනි නන්ද මාලිනී ද සිල්වා ගුණසේකර, කුඩාවස්කඩුව, වස්කඩුව |
| 23636 | ... | ගාර්දියේ පුංචිහේවාගේ සීලවතී, 943, අළුවිහාරේ, මාතලේ ... | ගල්ලෙනවත්තේ ගෙදර පදිංචි කොස්ගහමුලගෙදර ප්‍රේමරත්න, අළුවිහාරය, මාතලේ |
| 23637 | ... | ඇම්. සිබට් මැන්දිස්, ''සිතුමිණ'' ඉඩන්තොට, මාදම්පේ, අම්බලන්ගොඩ | සුවාරිස් අබේසේකර ආරියවතී, 196, පයිප රෝඩ්, හැව්ලොක් ටවුම, බම්බලපිටිය |
| 23638 | ... | විජේකෝන්ආච්චිලාගේ කිරිබණ්ඩා, වේරලන්ද, දලිවල, රඹුක්කන ... | සියඹලාපිටියේගෙදර සුමනදස, ගොඩගම්පොල, රඹුක්කන |
| 23639 | ... | ඇන්. ඒ. කරුණාරත්න, 152, තල්ගස්මොටේ, වේයන්ගොඩ ... | මද්දුමපතිරන්නැහේලාගේ නැන්සිනෝනා, තල්ගස්මොටේ, වේයන්ගොඩ |
| 23640 | ... | 1. මොහමඩ් නෙයිනමරික්කාර්ගේ භාර්‍යාව සෙයිනම්බුනාච්චියා, (2) කාදර්සයිබු මරික්කාර්ගේ භාර්‍යාව රෙයිහනාකු උම්මා, අංක 29, 5 වෙනි හරස් වීදිය, පුත්තලම | සෙල්ලම්මා සවුන්දරම්, ''සෝතිවාස'' සර්විස් රෝඩ්, පුත්තලම |
| 23641 | ... | සෙනරත්බණ්ඩාරගේ විල්මට් සෙනෙවිරත්න, උඩහිපන්පල, තුත්තිරිපිටිගම | වීරසේකරමුදියන්සේලාගේ ඇල්බින් වීරසේකර, ඇබව, කුලියාපිටිය |
| 23642 | ... | සියඹලාපිටියගේ දෙන් සෙබස්තියන්, බූංකිඳපාර, යක්කඩුව, ජාඇල ... | වෙල්ගමගේ මර්තිනු පෙරේරා, යක්කඩුව, ජාඇල |
| 23644 | ... | අමරසිංහ හේරත්මුදියන්සේලාගේ ලොකු මැණිකේ, වේවැල්වත්ත, අස්වැද්දුම | දේවගේ අසනේරිස් ප්‍රනාන්දු, වේවැල්වත්ත, අස්වැද්දුම, රත්නපුර |
| 23647 | ... | ඩබ්ලිව්. ඇස්. පෙරේරා, 921, පේරාදෙනිය පාර, මහනුවර ... | පී. දෝන සීලා පතිරත්න, 14, සංඝමිත්ත මාවත, මහනුවර |
| 23648 | ... | අන්තෝනිපිල්ලෙයි අඩෙයිකලසාමි, 4 වෙනි හරස් වීදිය, පොයින්ට් පේද්‍රු | විනයාර් නොහොත් විනාසිතම්බි වේලුපිල්ලේ, මයිලිඩ්ඩි, කන්කසන්තුරෙයි |
| 23650 | ... | විනාසිතම්බි සෙල්ලතුරෙයි, චාවාකච්චේරි උතුර, මීසාලෙයි ... | ඇම්. ඒ. සෙල්ලයියා (මියගොස්) භාර්‍යාව, ඩෙයි සිවකොලෙන්තු, ඩච් පාර, චාවාකච්චේරි |
| 23651 | ... | කනන්කේ ආරච්චිගේ ධර්මසේන, ඕවල, හුණුකැට ඇල, මාතලේ නැගෙණහිර, මාතලේ | බඩල්මුහන්දිරම්ලැගෙදර ඔදිරිස් හාමි, ඕවල, මාතලේ |
| 23653 | ... | මාතන් තම්බිතුරෙයි, කන්නන්කුලන් පටුමග, කෝපායි දකුණ, කෝපයි | අප්පයියා ධම්ලිංගම්, තිඩල්, නවවෙම්මනි පාර, කෝපායි දකුණ, කෝපායි |
| 23654 | ... | සරවනමුත්තුකනපතිපිල්ලෙයි, 6 වෙනි වෝඩ් එක, අනලෙයිතිවු ... | සතාසිවම් සන්මුගරාජා, 6 වෙනි වෝඩ් එක, අනලෙයිතිවු, යාපනය |
| 23655 | ... | (1) පුතිරාර් පෙරියතම්බි, (2) පොන්නම්මා, නෙල්ලියම්පාර, වූලිපුරම් ... | (1) ඇස්. මුතුකුමාරු (මියගොස්), (2) වියලච්චි, (3) රන්නෙශ්වරී, කල්ලෙයිවෙම්බඩ්, වූලිපුරම් |
| 23657 | ... | ජීවන්දරගේ නෝනහාමි නොහොත් එමානෝනා, අහුගම්මන, දෙල්ගොඩ | විජේලත්ආරච්චිගේ ලෝරන්ස්, හකුරුකුඹුර, දෙල්ගොඩ |
| 23658 | ... | (1) කුරුසුලෝරන්ස්, (2) මාර්සල් අම්මා, ස්මෝ බැරියර් නැගෙණහිර පාර, යාපනය | (1) සුසෙයිපිල්ලෙයි ස්ටැනිස්ලාවුස්, (2) තෙරෙසම්මා, අංක. 32, මවුන්ට් කාමෙල් පාර, යාපනය |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 23659 | කේ. ඩබ්ලිව්. බණ්ඩප්පුහාමි, උඩුගම, වේයන්ගොඩ | ජයලත්මුදියන්සේලාගේ තෝමස් සිංඤෝ, උඩුගම, වේයන්ගොඩ |
| 23660 | එඩ්වර්ඩ් රෝලන්ඩ් බස්නායක, වරාගොඩ, කැළණිය | එච්. අයි. එච්. පොන්සේකා, අංක 282, අළුත්කඩේ වීදිය, කොළඹ |
| 23656 | ඩී. සී. මුණසිංහ අප්පුහාමි, නාගහදූව, පයාගල | අදිමලිකන්කානන්ගේ මිලිනෝනා, නාගහදූව, පයාගල |
| 23661 | හේවාකන්ඩම්බිගේ ආරියදස, ''ජයන්ති'' සපුගොඩ, කඹුරුපිටිය | ඇල්බට් සියාසිංහ, පොල්ගහමුල්ල, ගතාර, කඹුරුපිටිය |
| 23663 | සොමු රාමලිංගම්, 160/1, පංසල පාර, යාපනය | සිවගුරුනාතාර් මානික්කම් රාසාගේ වැන්දඹුව පරශක්ති, පුතුර වෙම්මනි පාර, නල්ලූර් උතුර, නල්ලූර්, යාපනය |
| 23665 | දූවේ ආරච්චිගේ දෙන් පියදස, අංක 200, කැස්බෑව පාර, බොරලැස්ගමුව | මිරිහානආරච්චිගේ දෝන චාලට් ගුණවර්ධන, ටී. එච්. ලයනල් බාරේ, වේරහැර, බොරලැස්ගමුව |
| 23666 | ආර්. ඇම්. මේරිනෝනා, රෝයල් බේකරිය, අළුපතකඩ, අම්පිටිය | සෙනෙවිරත්න ජයලත්ගෙදර කරුණාරත්න, රෙදිපිලි වෙළඳ සැල, අළුපතකඩ, අම්පිටිය |
| 23667 | අබ්දුල් අසීස් මරික්කාර් මුහම්මදු මසූදු, 51/3, මස්ජිද් පාර, සීනාවත්ත, අළුත්ගම | නයිදුවාහන්දි චිත්‍රා වික්‍රමසේකර, '' ශ්‍රී විජය'', පැලවත්ත පාර, අළුත්ගම නැගෙනහිර, අළුත්ගම |
| 23668 | අබ්දුල් රසාක් මරිකාර් මොහමඩ් ඉස්මායිල්, 116ඒ, පිටවෙල, බේරුවල | ඇම්. ඇම්. ඇස්. අල්ලාපිච්චේ, බන්දූව, පොල්ගහවෙල |
| 23669 | රණසිංහ ආරච්චිගේ පවුලිස් පෙරේරා රණසිංහ, 237, කැගල්ලපාර, පොල්ගහවෙල | එන්සනෝනා, පරණතල, අල්ගම |
| 23670 | (1) සෙයිඩ් අහමඩ් යහියා, (2) ෂෙ. සපූර්, (3) මොහමඩ් සෙයිඩ් අලවි යහියා, 71/12, වැකන්ද පාර, කොළඹ 2 | දෙස්තර වී. ටී. ඇම්. ඇෆ්. වී. ද සිල්වා, ඇස්. එච්. ද සිල්වා, 170/10, අල්විස් පෙදෙස, හැඳල, වත්තල |
| 23671 | ලියනගේ උපවතී පෙරේරා, හාමිනේ, ගොරොක්ගහපොත්ත, දෙනගමුව පාර, පොල්ගහවෙල | මෙරගල් ජේම්ස්, (මියගොස්) උඩුකේදෙනිය. මෙ. ජේ. ඒ. වෙලිංටන්, මහජන නොතාරිස්, නාරම්මල |
| 23672 | එස්. ඒ. එම්. යසවර්ධන,31, මීවිටිගම්මන, ඌරාපොල | ආර්. ඕදිරිස් සිංඤෝ, රතඹලේ, ඌරාපොල |
| 23673 | වැවලගේ දෙන් ඇලිස් හාමි, ගැරජ් පාර, මුදුකටුව, මාරාවිල | වයි. ඇල්. ඇග්නස් හාමි, මුදුකටුව, මාරාවිල |
| 23676 | ජයලත්ආරච්චිගේ කරුණාවතී කරුණාරත්න, 112/1, ලක්ෂ්මී පාර, ගම්පහ | මිසි රණසිංහ සේතුගේ, ජයන්තාපාර, ගම්පහ |
| 23678 | ෆ්‍රැන්සිස් බ්‍රම්පි දිසානායක, රන්වාගොඩ, මාතර | නැන්සි ඇසෙන්සියා දිසානායක (මියගොස්), හැන්රි වින්සන්ට් විජේසිංහ ගුණතිලක (මියගොස්), භාර්‍යාව.—චන්ද්‍රානි කොතලාවල, රන්වාගොඩ දකුණ, රන්වාගොඩ |
| 23679 | බෝම්බුවලදේවගේ කිරිනේලිස්, දූවපන්සල පාර, පලාතොට, කළුතර | එච්. ඩී. පී. සිරිසේන, තොටගේ ජේමවතී, පොලිස් අභ්‍යාස විද්‍යාල පාර, නාගොඩ, කළුතර |
| 23680 | ජී. ඇම්. පිල්ලේයි, 42, රාවතාවත්ත, මොරටුව | (1) ලිඳමුලගේ රිචඩ් කොර්නේලිස් ද සිල්වා (මියගොස්), (2) තෙරෙසා ලිඩ්වින් බියුල්හා ද සිල්වා, (3) මේරි ලුසිලා වයලාද සිල්වා, අංක 66, රාවතාවත්ත පාර, චතුරටැන්කිය ඉදිරිපිට, මොරටුව |
| 23681 | පහලගේ දෙන් ජේදිරික් අප්පුහාමි, පහල නාරාගල, ගොවින්න | දෙහිවල ලියනගේ දෙන් ජේමරත්න විජයවර්ධන, ''විජයගිරි'', වගවත්ත, පෝරුවේදන්ඩ |
| 23684 | මොහමඩ් රපිජවාහිඩ්, මොහමඩ් ඉබ්‍රහිම් මොහමඩ් ජවාහිඩ්, රයිපල් රේන්ජ්, බදුල්ල | දිසානායකමුදියන්සේලාගේ මුතුබණ්ඩා, ඉඩමේගෙදර, වැල්ගොල්ලේ, දෙමෝදර |
| 23685 | රාජපක්ෂ ඇපාරාල්ලාගේ රම්මැනිකේ, දෙකිඳ, නාවලපිටිය | රාජපක්ෂඇපාරාල්ලාගේ රම්මැනිකා, කොටඹුලේ, ගොඩවෙල, පොල්ගහවෙල |
| 23687 | බී. ඇම්. ජේ. තිලකරත්න, අංක 80, ඇල්කඩුව පාර, උකුවෙල | (1) තිලකරත්නගේ භාර්‍යාව පී. එච්. ජේ. මැනිකේ, (2) පී. බී. දෙන් නයිදේගේ භාර්‍යාව ඩී. පි. ඇම්. ඥානවතී, කඩුවෙල, උකුවෙල (3) හීංබබා ධර්මසිරිගේ භාර්‍යාව වයි. ජී. ප්‍රංචිනා, ගුරුවෙල, උකුවෙල, (4) ලිඳගාවගෙදර කලූ, වැහිගල, ඇල්කඩුව, (5) වටගොඩගෙදර ජයසේන, කඩුවෙල, උකුවෙල, (6) බී. ඇම්. කරුණාරත්නගේ භාර්‍යාව ධර්මවතී, මරුකොන, උකුවෙල, (7) ඇම්. ඩී. ඒ. තිලකරත්නගේ දරුවෙක් පී. ආර්. තිලකරත්න, නිහරේපොල, උකුවෙල, (8) ඇම්. ඩී. ඒ. තිලකරත්නගේ දරුවෙක් එච්. ආර්. තිලකරත්න, නිහරේපොල උකුවෙල, (9) සේගුතම්බි අහමදු මීරාසයිබු, රයිතලාවෙල, උකුවෙල |
| 23688 | ඇම්. සූරියආරච්චි, ඉහලවත්ත, ගනේගොඩ | බණ්ඩාරිගොඩගේ ඇලිස් නෝනා, මානන්ගෙදර, බටුවන්හේන, ඇල්පිටිය |
| 23689 | මිල්ලනියගේ ඕස්ටින් පීරිස්, 231/21, පොල්හේනගොඩ පාර, කිරිල්ල පනේ, කොළඹ 5 | ඇම්. පී. ඊ. කීර්තිසිංහ, 20, ද මෝස් මාවත, කොළඹ 4 |
| 23690 | පියදස උක්වත්ත ලියනගේ, මහහේනවත්ත, පරදූව, අකුරැස්ස | (1) බියට්‍රිස් ඩයස් වික්‍රමසේකර, (2) චාර්ලිස් සමරවික්‍රම, 28, අකිරුපිටිය පාර, කැළණිය |
| 23691 | (1) පුරුදූනායකවඩුගේ සිරිසේන, (2) පී. ඩබලිව්. ආරයවර්ධන, මාදෙයියාව, කෑගල්ල | රාමසාමි නඩේසන්, 251/2, කෙලින් වීදිය, කෑගල්ල |
| 23693 | ලියනවඩුගේ පොඩිනයිදේ, කලෝටුවාව, නිට්ටඹුව | වරකාගොඩආචාරිගේ චාර්ලිස්හාමි, කත්තොට පාර, නිට්ටඹුව |
| 23696 | කුරුකුළආරච්චිගේ දෙන් නොයෙල් එමානුවෙල් නානායක්කාර, කැන්දලන්ද, පල්ලේවෙල | ලොකුවිතාරණගේ මිලින් චන්ද්‍රලතා ගුණවර්ධන, 43 බී. මුරුතලාව පාර, පේරාදෙණිය |
| 23697 | කුරුප්පුආච්චිගේ දෝන ජයවතී, තලගල, අඩවිකන්ද, ගෝනපල හංදිය... | කේ. ඩී. ඇලිස් නෝනා, හොරගල, බොරුකැටිය, කිරිවත්තුඩුව |
| 23699 | ඇස්. ඒ. ඥානවතී, කීනදෙනිය, අඹේපුස්ස | කොළඹගේ සේදිරිස් පෙරේරා, තලගම, අඹේපුස්ස |
| 23700 | ලියනගේ දෙන් ප්‍රැන්සිස් නානායක්කාර, 362, පරණ අම්බලම, කඳාන... | බී. ඕස්ට රුද්‍රිගු කරුණාරත්න, පරණ අම්බලම, කඳාන |
| 22859 | වෙදමුල්ලමදනායකගෙදර ඩේවිඩ්සිංඤෝ, (මියගොස්), භාර්‍යාව : ඩී. ඇම්. පොඩිමැණිකේ, 3 හේ කනුව, අංක 34, අම්පිටිය, නුවර | කනක්කපතිරණගේ ලූසිහාමිනේ (මියගොස්) පුරුෂයා : ඇම්. වී. ඊ. අබේසේකර, අම්පිටිය, නුවර |
| 23829 | අර්නස්ට් අල්කූර් ද අල්විස් අමරසේකර, 5, කෝට්ටේ නගර සභා පිට්ටනිය, නාවල පාර, රාජගිරිය | (1) බලකරු, ලේඩි ලෝහෝර් අරමුදල, පාර්සන්ස් පාර, රාජගිරිය, (2) මහජන බැංකුව, මීගමුව ; (3) පින්කෙ සමාගම, අයිස්ලන්ඩ් ගොඩනැගිල්ල, කොළඹ 3 ; (4) කාර්මික පිනැන්ස් සමාගම, ඇලෙක්සැන්ඩර් පෙදෙස, කොළඹ 7 ; (5) ලංකා බැංකුව, කොළඹ. |
| 23833 | සින්නතම්බි සුප්පයියා, 12/1, කැලෑ කන්තෝරුව පටුමහ, චුන්ඩුකුලි, යාපනය | (1) කන්දයියා කනගරත්නම්, 140, නුවර පාර, යාපනය ; (2) වෙනසිතම්බි සින්නදෙරේ, 165, කොම්බෝගම් නැගෙනහිර, යාපනය |
| 23834 | චන්නිආච්චිපතිරණහෙලාගේ සෝමරත්න, රත්නෙහෙරුව, මැටියගානේ | එච්. ඇම්, පුංචප්පුහාමි, එච්. ඇම්. පියසේන, රත්නෙහෙරුව, මැටියගානේ |

| ඉල්ලුම්පත් අංකය | ණය කරුගේ නම සහ ලිපිනය | ණය හිමියන්ගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 23835 ... | ආර්. කේ. සී. ගුණවර්ධන, ගුණවර්ධන වත්ත, අටකලන්පැන්න ... | බී. චන්ද්‍රනන්ද ස්ථවිර, වෙහෙරගොඩ විහාරය, අටකලන්පැන්න |
| 23779 ... | රත්නායක මුදියන්සේලාගේ රත්නායක, 56/2, රජමාවත පාර, රත්මලාන | හදුදූර ඉයුටින් ද සිල්වා, 18, හේන පාර, ගල්කිස්ස |
| 23766 ... | (1) තන්තිරිගේ සෝමසිරි ධර්මරත්න, (2) අඹේපිටියගේ දෝන නිමල් හාමිනේ, (3) තන්තිරිගේ සිරිසෝම ධර්මරත්න, (4) තන්තිරිගේ මිලී ධර්මරත්න, (5) තන්තිරිගේ සෝමවතී ධර්මරත්න, '' නිමල් '', දෝපේ, බෙන්තොට | කිරිබණ්ඩා මකුලොලුව, අතුරුවැල්ල, ඉඳුරුව |
| 23815 ... | සෙම්බුකුට්ටිආරච්චිගේ දොන් බර්නාඩ් සිල්වා, බොරගොඩවත්ත, මීනුවන් ගොඩ | ජයසේකර මුදලිගේ විල්මන්, යටියන, මීනුවන්ගොඩ |
| 23773 ... | පලනියන්ඩි සංගරලිංගම්, උඩුදෙනිය, මාරස්සන ... ... | (1) මාරසිංහ මුදියන්සේලාගේ මුතු බණ්ඩා, මහනුවර හරහා, මයිලපිටිය |
| 23846 ... | රන්පටිදේවගේ මිසි නෝනා, ඩබ්ලිව්. සුදත්හාමි බාරේ, උඩගන්ගොඩ, රත්මලවින්න, බලන්ගොඩ | සුදුහකුරුගේ ගුනේරිස්, 43, හපුතලේ පාර, කුඹගොඩ, බලන්ගොඩ |
| 23848 ... | සන්දරාදූරගේ ඇලෝසියස් සිල්වා, නයිනමඩම, වෙන්නප්පුව ... | රනමුකහලුගේ මර්තිනා ප්‍රනාන්දු, බොරලැස්ස, ලුණුවිල |
| 23843 ... | තලගලගේ ඩේවිඩ් ගුණතිලක, 47, අඟුරුවාතොට පාර, හොරණ ... | අබ්දුල් සලාම් මොහමඩ් අන්වර්, හොරේතුඩුව, මොරටුව |
| 23841 ... | කනන්තරදගේ අමාරිස්, පී. ආර්. සයිමන් බාරේ, ගැටන්ගම, රත්නපුර ... | ජයවීර මුදියන්සේලාගේ සුමණාවතී, මාරපොන, රත්නපුර |
| 23856 ... | (1) එලියතම්බි තම්බයියා, (2) නාගම්මා, 567, කන්කසන්තුරේ පාර, වන්නාර්පොනේ බස්නාහිර, යාපනය | කතිරෙසු පොන්නයියා, 16/6, චිනියා පටුමග, වන්නාර්පොන්නේ, නැගෙනහිර, යාපනය |
| 23711 ... | සුලෙයිමාන්ලෙබ්බේ සෙයිනුදීන්, 62, ගොරොක්ගහමඩ, බලංගොඩ ... | හේවාපොන්සේකාගේ රිචඩ් පොන්සේකා, බලගහමුල, බලංගොඩ |
| 23723 ... | අත්තනායකමුදියන්සේලාගේ පුංචි මැණිකේ, මුල්ලේගම, අඹතැන්න ... | ඇම්. ඇම්. මජීඩ්, බුලුගහතැන්න, අකුරණ |
| 23800 ... | සාරු මැයි නෝනා, 12, උද්‍යාන පාර, කොළඹ 5 ... ... | හයිඩ්‍රාමනි කර්මාන්ත ආයතනය, 65, වැතම් වීදිය, කොළඹ 11 |
| 23739 ... | කාරියවසන් බොව්තන්තිරි ජිනදස, ලීලාවාස, කිතුලම්පිටිය පාර, කැලේ ගම, ගාල්ල | සූටිවත් ඇපා සෙනෙවිරත්න, තිරාණගම, හික්කඩුව |
| 23770 ... | වර්ණකුලසූරිය බෙනී කුඬ ඉහලගොමුගෙමුව, කුරු/කිරින්ද ... | පල්ලියරාලලාගේ දොන් ජෝ ද අල්මේද, ඉහලගොමගොමුව |
| 23676 ... | විජේසිංහආරච්චිගේ දොන් ජිනිස්, '' විජයසෙවන '', ලාල්පෙ, කරතොට | කිරඹ පියරතන හිමි, කහවින්න පුරාණ විහාරාධිපති, කිරින්ද, පුහුල් ලවැල්ල |
| 23742 ... | කංකානිගමගේ ඇඩ්මන්, බණ්ඩාරවත්ත, උතුරු තලංගම ... | ඩී. ඊ. මුණසිංහ, 73, කොටා රෝඩ්, බොරැල්ල |
| 23847 ... | වේලුපිල්ලේ කන්දයියා, කන්ගම්මා, 221/3, කනගසබේ මාවත, වන්නාර් පොනේ, යාපනය | අන්නාලෙඩ්ස් හුනි ගේ භායඞාව, තාම්බු සෙල්වරත්නම්, හින්දු පාඨ ශාලාව පටු මග, වන්නාර්පොනේ, යාපනය |
| 23920 ... | ඇම්. කේ. සොසිනෝනා, හැඩිගමවත්ත, දෝපේ, බෙන්තොට ... | කස්ත්‍රිආරච්චිගේ දොන් ඊබට් අබේරත්න, දෝපේ, බෙන්තොට |
| 23735 ... | හේරත්මුදියන්සේලාගේ ඩිංගිරිබණ්ඩා, වීරපොකුණ හන්දිය, වීරපොකුණ | නිස්සංකආරච්චිගේ විමලාවතී නිස්සංක, වීරපොකුණ |
| 23752 ... | අමරතුංගආරච්චිගේ කරෝලිස් පෙරේරා, 100/1, වනාත පාර, මහරගම ... | ජයසේන කළුආරච්චි, 91, පරණ පාර, පන්නිපිටිය |
| 23900 ... | මොහම්මදු කසිම් මොහම්මදු පාරුක්, මුරුකවෙල, මාවනැල්ල ... | මුහන්දිරම් රාලලාගේ පියදස, මිල්ලනිගොඩ, ඇරව්පොල, උස්සා පිටිය, ගල්අතර |
| 23909 ... | කත්නාදූර ජෝස් අප්පු, බූස්ස, මැදවල, මාගල්ගොඩ ... | පිටිගල ලියනගෙ ජිනදස, බූස්ස, මහහැගොඩ, මීරන්ගොඩ |
| 23915 ... | මාපානාර් කනගරත්නම්, '' තොප්පු '', තුන්නලෙය් දකුණ, කරවෙඩ්ඩි ... | අල්වාපිල්ලෙයි සුබ්‍රමානියම්, කුප්පුලානෙයි, තම්බාසෙට්ටි, පුලෝලි දකුණ, පොයින්ට් පේද්‍රු |

3-652

---

## පිස්සු බල්ලන්

බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකිඳ, වියලුව හා බින්තැන්න ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ තුල දැනට බල්ලන්ගෙන් අන්තරා සිදු වන බැවින්, පිස්සු බල්ලන් සම්බන්ධ ආඥපනතේ අංක 476 දරන පරිච්ඡේදයේ අංක 11 දරන වගන්තිය යටතේ, 1970 අප්‍රේල් මස 1 වැනි දින සිට මාස හයකට එම ප්‍රදේශයන්, බදුල්ල මහ නගර සභාවට අයත් ප්‍රදේශය හැර පිස්සු බලු රෝගයට යටත් ප්‍රදේශයන් ලෙස ප්‍රකාශ කරන බව මෙයින් දැනුම් දෙමි.

2. එබැවින් බදුල්ල දිස්ත්‍රික්කයේ ඉහත ප්‍රකාශනයට යටත් කළ ප්‍රදේශ තුල නොබඳින ලද හෝ අන් කෙනෙකුගේ ගෙදරක හෝ වත්තක හැර, අල්ලා නොගෙන යන බල්ලන් ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ වෙනයම් ස්ථානයක සිටියොත් ඌ වහාම මරා දමන්ට පුලුවන් බව මෙයින් දන්වනු ලැබේ.

බ. සු. විජේවීර,
බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩබලන දිසාපති.

1970 මාර්තු මස 13 වැනි දින,
බදුල්ලේ දිසාපති කාර්යාලයේදීය.

3-548

---

පීවීඇස් 1092

## (145 වැනි අධිකාරය වන) සමාගම් ආඥපනත ඉච්ඡානුග ඈවර කිරීමට පාත්‍ර ආනන්ද බ්‍රදර්ස් ලිමිටඩ් නාම කපාදැමීම පිණිස 277(4) වැනි වගන්තිය යටතේ දැන්වීම

(145 වැනි අධිකාරය වන) සමාගම් ආඥ පනතේ විධිවිධාන යටතේ 1952 පෙබරවාරි 15 වැනි දින සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වන, (ඈවර කිරීමට පාත්‍ර) ආනන්ද බ්‍රදර්ස් ලිමිටඩ් හි ඈවරකරුවකු ක්‍රියා නොකරන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති හෙයින්,

ආනන්ද බ්‍රදර්ස් ලිමිටඩ් හි නම කපා දැමීමට විරුද්ධව හේතු නොදැක්වුවහොත් මෙදින සිට තෙමසක් ගතවූ විට එම සමාගමේ නම මෙම කාර්යාලයෙහි තබා තිබෙන සමාගම් ලේඛනයෙන් කපා හැර සමාගම විසුරුවා හරින බව, (145 වැනි අධිකාරය වන) සමාගම් ආඥ පනතේ 277 (4) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරන සමාගම් රෙජිස්ට්‍රාර් ජයරත්නම් fපිලික්ස් පොන්නම්බලම් වන මා මෙයින් නිවේදනය කරන බැව් ඔබ දැනගත යුතුය.

ජේ. එf ජ්. පොන්නම්බලම්,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1970. 2. 5 වැනි දින,
කොළඹ 1, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේදීය.

3-540

---

## සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)

**277 (3) වගන්තිය යටතේ, ද කලම්බු නෝර්ත් පීපල්ස් ට්‍රේඩිං කොම්පැණි ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම**

සමාගම් ආඥපනතේ (145 අධිකාරය) විධිවිධානය යටතේ 1966. 3. 11 දින සංස්ථාපිත සමාගමක් වන ද කලම්බු නෝර්ත් පීපල්ස් ට්‍රේඩිං කොම්පැණි ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නො වන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ද කලම්බු නෝර්ත් පීපල්ස් ට්‍රේඩිං කොම්පැණි ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ට්‍රරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් ජයරත්නම් පීfලික්ස් පොන්නම්බලම් වන මම, සමාගම් ආඥපනතේ (145 අධිකාරය) 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ජේ. එf ජ්. පොන්නම්බලම්,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1970 මාර්තු මස 16 දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේදීය.

3-605

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡෙදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව රොබට් සමරසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගි ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචිකිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
|---|---|---|---|---|---|
| 978 ... | 14.3.1970 ... | සාන්ත සැබැස්ටියන් දේවස්ථානය ... | කරදි පුවල් පුත්තලම් පත්තු, පුත්තලම් දිස්ත්‍රික්කය | ගරු වර්ණකුලසූරිය ග්‍රෙගරි හැරල්ඩ් ප්‍රනාන්දු දේවගැති තැන | රෝමානු කතෝලික |

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්‍යාලය,
කොළඹ, 1970 මාර්තු 14.

ආර්. සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

3–513

## නිවේදනයයි

**1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත**

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ මහනුවර ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය මවිසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970. 3. 2.

### සුළු වාරිමාර්ග වැඩ වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නම සහ විස්තරය: බලීතියන් නැවෙල අමුණ ජේ/21 (10.00×3.35).

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය—

පෞද්ගලික ඉඩම්: දළ වශයෙන් අක්කර 16 යි;

රජයේ ඉඩම්: නැත.

3. එකඟවූ කොන්දේසි නම්—

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම්:—

මාඔය හරහා යොදා ඇති අඩි 100 ක් දිගැති පස්වලින් සාදා ඇති බැම්මද අළුතින් සොරොව්වද ස්ථිර වශයෙන් ඉදි කිරීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 17,500 දක්වා නැතීම රජය විසින් භාරගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරු වල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම් වල අයිති කරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපති වරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥාපනතේ 7 වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

3–543

## දැන්වීමයි

**ර/බලංගොඩ යශෝධරා අඳ බිහිරි පාසැල, බලංගොඩ**

රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද කෝරළයයේ බලංගොඩ මිරිස්වත්තේ පිහිටි ඉහත නම් සඳහන් උපකෘත පාසැලේ දැනට නිතත්‍යානුකූලව අනුමතකළ කළමනාකරුවකු නොසිටින නිසාත් පාසැලේ පාලන කටයුතු අසතුටුදායක තත්ත්වයකට පත් වී ඇති නිසාත්, ඉංග්‍රීසි උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි වගන්තියේ iii වන ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත නම් සඳහන් පාසැලේ කළමනාකාරිත්ත්වය සුදුසු කළමනාකරුවකු පත්කරනතුරු, තාවකාලිකව 1970 අප්‍රියෙල් මස 1 දින පටන් මා වෙත භාරගන්නට යෙදුනු බැව් මෙයින් නිවේදනය කරමි.

ඇස්. පී. ජයසූරිය,
රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 මාර්තු මස 17 වෙනි දින,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
රත්නපුරය.

3-567

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

**බස්නාහිර කොට්ඨාශය** **කළුතර දිස්ත්‍රික්කය**

### රථ වාහන ගමනාගමනයට බාධා

**රයිගම-අගුරුවාතොට පාරේ අංක 8/1 දරණ බෝක්කුව නැවත තැනීම**

ඉහත සඳහන් බෝක්කුව, නැවත තැනීම සඳහා 70. 3. 21 දින සිට මාසයක් වසා තබන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

මේ කාලසීමාව තුළදී අතුරු පාරක් වශයෙන් කෙසෙල්හේනාව හන්දියේ සිට යාල හරහා අගුරුවාතොට පාරට යාහැකිය.

එස්. සෙල්වදුරෙයි,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1970 මාර්තු 18 දිනදීය.

3—610

## වන්දනා ගමන් ආඥාපනත

**1970 කතරගම සිංහල/හින්දු අළුත් අවුරුදු උත්සවය**

යථෝක්ත උත්සවය 1970 අප්‍රේල් මස 13, 14 සහ 15 යන දිනයන්හිදී පැවැත්වෙන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම උත්සවයකට අදාලව 1948 අප්‍රේල් මස 30 වැනි දින අංක 9,859, 1961 ජූලි මස 7 දින අංක 12,508 සහ 1962 මාර්තු මස 2 වැනි දින අංක 12,947 දරණ රජයේ ගැසට් පත්‍රවල පළවූ නියෝග කෙරේ අවධානය යොමු කරවමි.

පී. ජී. පුංචිහේවා,
මොනරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 මාර්තු මස 13 වැනි දින,
මොනරාගල දිසාපති කාර්යාලයේ දී ය.

3-594

---

## රථ වාහන ගමනා ගමනයට බාධා

### පිට්වැල්ල—රණපනාදෙනිය පාර

දකුණු කොට්ඨාශය — ගාලු දිස්ත්‍රික්කය

ඉහත සඳහන් පාරේ හැගොඩ සිට රණපනාදෙනිය දක්වා ඇති මාර්ග කොටස වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සෑදීමට පිළියෙල කර ඇති ජල පාලක බැම්ම තැනීම සඳහා නැවත දන්වනතුරු සියලුම රථවාහන ධාවනය කළ නොහැකිසේ වසා තබා ඇති බැව් මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

2. සුලු බර රථවාහනාදියේ ධාවනය සඳහා වෛකල්පික මාර්ගය, බුස්ස හැගොඩ සිට හදනගොඩ ගම් කාර්ය සහා මාර්ගය ඔස්සේ ය.

ඇස්. සෙල්වදොරේ,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1.
1970 මාර්තු 17 දින දීය.
3-644

---

## දැන්වීමයි

### අම්/දිගාමඩුළු විද්‍යානන්ද පිරිවෙන අම්පාරේ

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාරේ පිහිටි අම්/දිගාමඩුළු විද්‍යානන්ද පිරිවෙන රජයේ ආධාර ලබන කණිෂ්ඨ පිරිවෙනක් ලෙස ලියාපදිංචි කරන මෙන් ඉල්ලීමක් යථෝක්ත පිරිවෙනේ කෘත්‍යාධිකාරී ගරු හැගොඩ ඉන්දසාර ස්ථවිරයන් වහන්සේගෙන් ලැබී ඇත.

මෙම ඉල්ලීමට විරුද්ධවාදිකම් වේනොත් මෙම දැන්වීම පළවූ දින සිට දින 30ක් තුළ මා වෙත ඉදිරිපත් කරන මෙන් මෙයින් දැනුම් දෙමි.

වී. සන්කරලිංගම්,
නැගෙනහිර ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

බීපී/බී. 566
මඩකලපුව,
අධ්‍යාපන කාර්යාලයේ දීය.
3-681

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද ... | 70. 2.27 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70. 3.13 සිකුරාද ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද ... | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් ... | 70. 4. 3 සිකුරාද ... | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද ... | 70. 4. 3 සිකුරාද | ප.ව | 3.30 |
| | 70. 4.17 සිකුරාද .. | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද .. | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි ... | 70. 5. 8 සිකුරාද ... | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද .. | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි ... | 70. 6. 5 සිකුරාද ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.